# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 73 — 1973 අගෝස්තු 17 වැනි සිකුරාදා — 1973.08.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ඉගානුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... ... ... | 847 |
| ජනාධිපතිතුමාණන් විසින් කරන පත් කිරීම් ආදිය ... ... | — | මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන පත්කිරීම් ආදිය ... ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — | ආදයම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| අධිකරණ සේවා උපදේශක මණ්ඩලයෙන් කරන පත්කිරීම් ආදිය ... | — | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශන ... ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 845 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්... ... ... | 855 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — | " සුරාබදු ආඥාපනත " පිළිබඳ දැන්වීම් ... ... | — |


සැළකිය යුතුයි.—පශු වෛද්‍ය සහ පශු වෛද්‍ය වෘත්තික (සංශෝධන) පනත් කෙටුම් පත, ණය සහනදායක (සංශෝධන) පනත් කෙටුම් පත සහ දුම්කොළ බදු (සංශෝධන) පනත් කෙටුම් පත 1973 අගෝස්තු මස 10 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

## වෙනත් පත් කිරීම් ආදිය

**1973 අංක 394**

පා4/2/13.
පා4/2/15.
පා4/1/5/15/73.
පා4/1/5/15/73(මා).
පා4/1/14/61/73.
පා4/1/16/73.
පා4/1/29/102/73(මා).

**අධිකරණ ආඥාපනත**

(6 වන අධිකාරිය වූ) අධිකරණ ආඥාපනතෙහි 82 සහ 83 වන වගන්තිය යටතේ මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, අධිකරණ ඇමති ෆිලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම,

1. අබේකෝන් අබේසිංහ මුදියන්සේලාගේ මැදිවක වලව්වේ විකිරි බණ්ඩා මැදිවක මහතා ගම්පහ බටහිර (උ.දු.) ගම් ප්‍රදේශයේ සමගිදායකයින්ගේ සභාවේ සභාපති ධූරය කරණ කාලය තුළ මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

2. අළුත්ගෙදර ඩිංගිරිබණ්ඩා මහතා ඊනාමළුව කෝරළේ ගම් ප්‍රදේශයේ සමගිදායකයින්ගේ සභාවේ සභාපති ධූරය දරණ කාලය තුළ මාතලේ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

3. උදුමාලෙබ්බේ මරික්කාර් මුහම්මදිස් මායිල් මහතා අක්කරෙයිපත්තු මධ්‍යම ගම්කාර්ය සභාවේ කොට්ඨාශ අංක 5, 6, 7, 8, 9 හා 10 ඇතුලත් ප්‍රදේශයේ සමගිදායකයින්ගේ සභාවේ සභාපති ධූරය දරණ කාලය තුළ මඩකලපුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

4. ඒකනායක දුනුකාර මුදියන්සේලාගේ උක්කුබණ්ඩා පෙතියාගොඩ මහතා ගන්අට පළාත (කු. ප.) ගම් ප්‍රදේශයේ සමගිදායකයින්ගේ සභාවේ සභාපති ධූරය දරණ කාලය තුළ මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

5. ෂෙල්ටන් ගුණරත්න මහතා දෙවිනුවර සුළු නගර සහ ප්‍රදේශයේ සමගිදායකයින්ගේ සභාවේ සභාපති ධූරය දරණ කාලය තුළ මාතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවට පසුව මෙහි ලැබෙන සියලුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1971 මාර්තු මස 19 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

6. හේරත් මුදියන්සේලාගේ කරුණාරත්න හේරත් මහතා කුලියාපිටිය නගර සභා ප්‍රදේශයේ සමගිදයකයින්ගේ සභාවේ සභාපති ධූරය දරණ කාලය තුළ කුරුණෑගල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

7. විරකෝන් මුදියන්සේලාගේ මැද වලව්වේ කිරිබණ්ඩා වීරකෝන් මහතා ගම්පහ නැගෙනහිර (උ.දු.) ගම් ප්‍රදේශයේ සමගි දායකයින්ගේ සභාවේ සභාපති ධූරය දරණ කාලය තුළ මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චය කාරවරයෙකු වශයෙන් ද,

8. ඇල්බට් අබේවික්‍රම මහතා මොරවක ගම් ප්‍රදේශයේ සමගි දායකයින්ගේ සභාවේ සභාපති ධූරය දරණ කාලය තුළ මාතර අධිකරන දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

9. ලයනල් පියතිස්ස ජයතුංග මහතා කුරුවිට ගම් ප්‍රදේශයේ සමගිදයකයින්ගේ සභාවේ සභාපති ධූරය දරණ කාලය තුළ රත්නපුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චය කාරවරයෙකු වශයෙන් ද,

10. චන්ද්‍රසේකර ජයරත්න මුදියන්සේලාගේ ලොකුබණ්ඩා චන්ද්‍ර සේකර මහතා නිකවැරටිය ගම් ප්‍රදේශයේ සමගිදයකයින් ගේ සභාවේ සභාපති ධූරය දරණ කාලය තුළ කුරුණෑගල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

11. කුරුප්පු මුදියන්සේලාගේ සුමනපාල මඩබාවිට මහතා වගපනහ පල්ලේසියපත්තුව ගම් ප්‍රදේශයේ සමගිදයකයින්ගේ සභාවේ සභාපති ධූරය දරණ කාලය තුළ මාතලේ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

12. කඩිරේසුපිල්ලේ කන්දයියා මහතා අක්කරෙයිපත්තු මධ්‍යම ගම්කාර්ය සභාවේ කොට්ඨාශ අංක: 1, 2, 3 හා 4 ප්‍රදේශයේ සමගිදයකයින්ගේ සභාවේ සභාපති ධූරය දරණ කාලය තුළ මඩකලපුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චය කාරවරයෙකු වශයෙන් ද,

13. ධර්මදාස වික්‍රමසිංහ මහතා බෙරලපනාතර ගම් ප්‍රදේශයේ සමගි දායකයින්ගේ සභාවේ සභාපති ධූරය දරණ කාලය තුළ මාතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

14. කේ. ඇම්. සිරිසේන මහතා බුත්තල ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය දරණ කාලය තුළ බදුල්ල අධිකරණ දිස්ත්‍රික් කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

15. පී. ඩී. සමරවීර මහතා පට්ටිපොල ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය දරණ කාලය තුළ බදුල්ල අධිකරණ දිස්ත්‍රික් කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

16. සී. ඒ. කරවිට මහතා කතරගම ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය දරණ කාලය තුළ බදුල්ල අධිකරණ දිස්ත්‍රික් කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

17. ජී. මූ. මුතුබණ්ඩා මහතා කන්දපැල්ල අංක 1 ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය දරණ කාලය තුළ බදුල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

18. ඩී. ඇම්. උක්කුබණ්ඩා මහතා මැදගම ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය දරණ කාලය තුළ බදුල්ල අධිකරණ දිස්ත්‍රික් කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

19. ඩබ්ලිව්. ඇස්. පී. නිමල්දාස් මහතා කන්දපල්ල අංක 2 කොස්ලන්ද ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය දරණ කාය තුළ බදුල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

20. ඒ. ඇම්. ජයවර්ධන මහතා බින්තැන්න ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය දරණ කාලය තුළ බදුල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

21. එච්. ඇම්. ගුණසේකර මහතා කුඹල්වෙල කෝරලය ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය දරණ කාලය තුළ බදුල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

22. ආර්. ඇම්. ඒ. රත්නායක මහතා මහපලාත සහ බඹරගම ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය දරණ කාලය තුළ බදුල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

23. බී. පී. කේ. ඇම්. සුදුබණ්ඩා මහතා දඹල්ල කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය දරණ කාලය තුළ බදුල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

24. ඩබ්ලිව්. ඇම්. ජයවර්ධන මහතා බින්තැන්න කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය දරණ කාලය තුළ බදුල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

25. එච්. ඇම්. අප්පුහාමි මහතා දඹවිනිපලාත හදිසි මරණ පරීක්ෂක ධූරය දරණ කාලය තුළ බදුල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

26. ජේ. ඇම්. හින්බණ්ඩා මහතා මහ වැදිරට හදිසි මරණ පරීක්ෂක ධූරය දරණ කාලය තුළ බදුල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

27. බී. එච්. ඇම්. අප්පුහාමි මහතා පස්සර හදිසි මරණ පරීක්ෂක ධූරය දරණ කාලය තුළ බදුල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

28. එච්. ඇම් පුංචිරාල මහතා බින්තැන්න හදිසි මරණ පරීක්ෂක ධූරය දරණ කාලය තුළ බදුල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

29. එච්. ඇම්. අප්පුහාමි මහතා බින්තැන්න නැගෙනහිර හදිසි මරණ පරීක්ෂක ධූරය දරණ කාලය තුළ බදුල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

30. ඩබ්. ඇම්. කරුණාරත්න මහතා මහපලාත හදිසි මරණ පරීක්ෂක ධූරය දරණ කාලය තුළ බදුල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

31. කේ. ඒ. ඥානතිලක මහතා ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

32. පී. ඒ. සෝතන් පෙරේරා මහතා ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

33. චන්ද්‍රලතා ලියනගේ මහත්මිය ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරියක් වශයෙන් ද,

34. කෝඹල ලියනගේ සත්‍යනාත් ධර්මරත්න මහතා ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

35. අබ්දුල් කපූර් මොහොමඩ් හසන් ඩීන් මහතා ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාරවරයකු වශයෙන් ද,

36 සී. විලියම් නානායක්කාර මහතා ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

37. නීතිඥ චන්ද්‍රසේන සපරමාදු පිනිදිය මහතා මාතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු සහ නිල නොලත් මහෙස්ත්‍රාත් වරයෙකු වශයෙන් ද,

38. නීතිඥ බී. පී. පියසේන මහතා මාතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු සහ නිල නොලත් මහෙස්ත්‍රාත්වරයෙකු වශයෙන් ද,

39. උඩුගොඩගේ ඩේවිඩ් පෙරේරා මහතා හලාවත අධිකරණ දිස්ත්‍රික් කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

40. වරුෂප්පෙරුම කුලතිලක අත්තනායක මුදියන්සේලාගේ චන්ද්‍ර තිලක මහතා හලාවත අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

පත් කරමි.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
අධිකරණ ඇමති.

1973 අගෝස්තු මස 03 වෙනි දින.
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

8-682—73. 08. 17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

**1973 අංක 395**

අංකය : සී. 225/සීඅයිඑස් සී.

**ශ්‍රී ලංකා නාවික හමුදාව—ස්ථිර බලකාය—අනිවාර්ය විශ්‍රාම ගැන්වීම**

ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායේ පහත නම සඳහන් නිලධාරියා 1973 අගෝස්තු මස 01 දින සිට අනිවාර්යයෙන් විශ්‍රාම ගන්වන ලදී.

වැඩබලන උප ලුතිනන් මොහොමඩ් ජුනයිඩ් මොහමඩ් අයුබ්, ශ්‍රී ලං. නා. හ.

ඇම්. ඩී ඩී. පීරිස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩබලන ලේකම්.

1973 අගෝස්තු 2 දින,
කොළඹ දී ය.

8–788—73. 08. 17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

**1973 අංක 396**

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

මිරියාගොඩ පදිංචි මද්දුම කුමාරගේ සෝදිරිස් ප්‍රේමවර්ධන කුමාරරත්න මහතා මිරියාගොඩ බලිමුල්ලේ වාසස්ථානය සහ කාර්යාලය ද මිරියගොඩ අතුරු කාර්යාලය ද ඇතුව බලපිටිය අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත් කර තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ක්වූ අගෝස්තු මස 4 දින,
කොළඹදී ය.

8–826—73. 08. 17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

## ආණ්ඩුවේ නිවේදන

එල්. සී.—බී. 97/41. පීඑන්. 1950

**විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය**

1948 අංක 13 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත 1934 පෙබරවාරි මස 5 වැනි දින දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයෙහි 51 වැනි වගන්තිය යටතේ වූ නිවේදනයකි.

fපී. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍ය.

1973.8.2 දින,
කොළඹදී ය.

නිවේදනය

කලින් කල සංශෝධනය කරනු ලැබූ 1934 පෙබරවාරි මය 5 වැනි දින දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය, එහි 20 වැනි වගන්තියෙහි (2) වැනි උපවගන්තියෙහි "රජය යටතේ කළ සේවයට" යන වචන වෙනුවට "**මෙම ව්‍යවස්ථාවල 32 (ii) වැනි වගන්තියේ** විධිවිධානවල කුමක් සඳහන්ව ඇතද, ආණ්ඩුව යටතේ කළ සේවයට" යන වචන යෙදීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

8–755—73. 08. 17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

එල්. ඩී.—බී 104/44.

**භාර ආඥාපනත**

114 වන වගන්තිය යටතේ නියමය

ශ්‍රී ලංකා වෛද්‍ය පුස්තකාලයේ භාරකරුවන් වූ දොන් ජිනදාස ආටිගල දොස්තර මහත්මයා, ලෙස්ටර් ඩිරෝගෝ කැමරන් ඔස්ටින් දොස්තර මහත්මයා, **ෂෙල්ටන් ඇලෝෂියස් කබ්රාල් දොස්තර** මහත්මයා රාජදුරේ සෙල්ලයියා තනබාලසුන්දරම් දොස්තර මහත්මයා සහ එඩ්මන්ඩ් මෙඩොන්සා විජේරාම දොස්තර මහත්මයා (87 වන අධිකාරය වූ) භාර ආඥාපනතෙහි 114 වන වගන්තිය යටතේ තමන් නීතිගත කරනු ලබන ලෙස අධිකරණ අමාත්‍යවරයාගෙන් ඉල්ලුම් කර ඇති හෙයින් :

ඉහත කී වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අධිකරණ අමාත්‍ය fපීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, එකී භාරකරුවන් නීතිගත කිරීමට මේ නියමයෙන් බලය පවරන අතර—

(අ) එකී භාරකරුවන් සහ එකී ශ්‍රී ලංකා වෛද්‍ය පුස්තකාලයේ නියෝග ප්‍රකාර යථා පරිදි පත් කරනු ලැබූ ඔවුන්ගේ තත්කාලීන අනුප්‍රාප්තිකයන් "ශ්‍රී ලංකා වෛද්‍ය පුස්තකාලය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු යයි ද;

(ආ) එකී භාරකරුවන් විසින් චංචල හා නිශ්චල යන දෙවර්ගයේම සියලු වර්ගවලට අයත් දේපළ එකී භාරය වෙනුවෙන් එකී නාමයෙන් හා අභිධානයෙන් ලැබීම, ගැනීම, දැරීම, සන්තකයෙහි තබා ගැනීම සහ බැහැර කිරීම කළ හැකි යයි ද; එසේ ම

(ඇ) එකී භාරය පිළිබඳ සියලු නඩුහබවල දී කවර අධිකරණයක දී හෝ වෙනත් කවර ස්ථානයක දී වුව ද එකී නාමයෙන් හා අභිධානයෙන් නඩු පැවරීමට හා නඩු පවරනු ලැබීමට ද උත්තර බැඳීමට හා උත්තර බඳිනු **ලැබීමට** ද විත්තිය ලෙස පෙනී සිටීමට හා එසේ නියෝජනය කරනු ලැබීමට ද එකී භාරකරුවන්ට නීතියෙහි ලා හැකිකම හා **සුදුසුකම තිබිය යුතු යයි ද**

මෙයින් විධාන කර ප්‍රකාශ කරමි.

මේ නියමය ප්‍රත්‍යාදිෂ්ට කළ හැකිය; නැතහොත් අවශ්‍ය බව මට පෙනීයන ආකාරයකින් කලින් කල වෙනස් කළ හැකිය, නොහොත් සංශෝධනය කළ හැකිය.

fපී. ආර්. ඩී. බණ්ඩාරනායක,
අධිකරණ අමාත්‍යවරයා.

1973 මැයි මස 25 වන දින,
කොළඹ දී ය.

8–610—73. 08. 17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

**තැපැල් කාර්යාල ආඥාපනත**

(190 වැනි අධිකාරය වන) තැපැල් කාර්යාල ආඥාපනතේ 16 වැනි වගන්තිය යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යවරයා විසින් සාදන ලද රීතිය.

ඕ. කුමාරසූරියර්,
තැපැල් හා විදුලි සංදේශ ඇමති.

1973 ජූලි මස 31 වැනි දින,
කොළඹ දී ය.

රීතිය

(190 වැනි අධිකාරය වන) තැපැල් කාර්යාල ආඥාපනතේ 16 වැනි වගන්තිය යටතේ සාදනු ලැබ 1966 අගෝස්තු 5 වැනි දින අංක 14,707 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලදුව, 1973 මැයි 14 වැනි දින අංක 59/2 දරණ ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රීතියෙන් අන්තිම වරට සංශෝධිත රීතියෙහි උපලේඛනයේ 111 වැනි විෂයට ඉක්බිතිවම පහත සඳහන් අළුත් විෂයයන් ඇතුළත් කිරීමෙන් එම රීතිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

"112. සීගිරි බිතුසිතුවමක් පිළිබිඹු කරන්නාවූ රුපියල් 1.55 වටිනා තැපැල් හා ආදායම් (සමරු) මුද්දර.

113. පොළොන්නරුවේ ගල්විහාරයේ ඇති බිතුසිතුවමක් පිළිබිඹු කරන්නාවූ ශත 90 වටිනා තැපැල් හා ආදායම් (සමරු) මුද්දර.

114. පොළොන්නරුවේ තිවංක පිළිමගෙයි ඇති බිතු සිතුවමක් පිළිබිඹු කරන්නාවූ ශත 50 වටිනා තැපැල් හා ආදායම් (සමරු) මුද්දර.

115. මහනුවර අසල දෙගල්දොරුව විහාරයේ ඇති බිතුසිතුවමක් පිළිබිඹු කරන්නාවූ ශත 35 වටිනා තැපැල් හා ආදායම් (සමරු) මුද්දර."

8–668/1—73. 08. 17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

### මුද්දර ආඥාපනත

(247 වැනි අධිකාරය වන) මුද්දර ආඥාපනතේ 6 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලද රීතිය.

බර්නාඩ් සොයිසා,
වැඩබලන මුදල් අමාත්‍ය.

1973 ජූලි මස 31 වැනි දින,
කොළඹ දී ය.

රීතිය

(247 වැනි අධිකාරය වන) මුද්දර ආඥාපනතේ 6 වැනි වගන්තිය යටතේ සාදනු ලැබ, 1966 අගෝස්තු 5 වැනි දින අංක 14,707 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලදුව 1973 මැයි 14 වැනි දින අංක 59/2 දරණ ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රීතියෙන් අන්තිම වරට සංශෝධිත රීතියෙහි උපලේඛනයේ 110 වැනි විෂයයට ඉක්බිතිවම පහත සඳහන් අළුත් විෂයයන් ඇතුළත් කිරීමෙන් එම රීතිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

"111. සීගිරි බිතුසිතුවමක් පිළිබිඹු කරන්නාවූ රුපියල් 1.55 වටිනා තැපැල් හා ආදායම් (සමරු) මුද්දර.

112. පොළොන්නරුවේ ගල් විහාරයේ ඇති බිතුසිතුවමක් පිළිබිඹු කරන්නාවූ ශත 90 වටිනා තැපැල් හා ආදායම් (සමරු) මුද්දර.

113. පොළොන්නරුවේ තිවංක පිළිමගෙයි ඇති බිතුසිතුවමක් පිළිබිඹු කරන්නාවූ ශත 50 වටිනා තැපැල් හා ආදායම් (සමරු) මුද්දර.

114. මහනුවර අසල දෙගල්දොරුව විහාරයේ ඇති බිතුසිතුවමක් පිළිබිඹු කරන්නාවූ ශත 35 වටිනා තැපැල් හා ආදායම් (සමරු) මුද්දර."

8–668/2—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

### උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත

#### 5 වන වගන්තිය යටතේ නිවේදනය

(110 වෙනි අධිකාරය වන) උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ පනතේ 5 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, 1935 සැප්තැම්බර් 20 වන දින අංක 8, 146 දරණ ගැසට් පත්‍රයේ අතිරේක යෙහි පළ කරනු ලැබ කලින් කල සංශෝධනය කරනු ලැබූ නිවේදනය, එහි වූ උපලේඛනයෙහි "වයඹ පළාත—කුරුණෑගල දිස්ත්‍රික්කය" යන ශීර්ෂය යටතේ :—

(1) රකෝපත්තු කෝරලේ කොට්ඨාශයට අදාල වන එහිවූ අංක 56 දරන විෂය වෙනුවට මෙහි වූ "අ" උපලේඛනයෙහි සඳහන් විෂය ආදේශ කිරීමෙන් ; හා

(2) එහි අංක 56 දරන විෂයට ඉක්බිතිව මෙහි වූ "ආ" උපලේඛනයෙහි සඳහන් අංක 57 දරන අළුත් විෂය අන්තර් ගත කිරීමෙන් ;

1973.9.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම නිවේදනයෙන් සංශෝධනය කරමි.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යවරයා.

1973 ජූලි මස 24 දින,
කොළඹ දී ය.

"අ" උපලේඛනය

56. පහත සඳහන් ගම් වලින් සමන්විත රකෝපත්තු කෝරලේ නැගෙනහිර කොට්ඨාශය :

අකුරුමුල්ලේගෙදර
අඹහැර
බඩහැද්දර
බඹරගහපැලැස්ස
බුළුපිටිය
දලුපොතේගෙදර
දමුණුගල
දන්ගොල්ල
දන්වැල්ල
ගලබඩගම
ගණන්කැටේ
ගෙපල්ලව
ගොඩවිට
හෙල්ගම
හේනේපොල
කදුරුගහමඩිත්ත
කණුමලේ
කන්නැහැපොල
කොහාන
පඹේ
පිදුරුවැල්ල
රත්මලේ
සියඹලාවැහැර
උහුමීය
වල්පොලගෙදර
වෙලගෙදර
වේවැල්පොල

"ආ" උපලේඛනය

57. පහත සඳහන් ගම්වලින් සමන්විත රකෝපත්තු කෝරලේ බස්නාහිර කොට්ඨාශය :

අහුගොඩ
අල්ගම
අමුණුගම
දෙවෙනි පිදිවිල්ල
ඉලුක්ගොඩ
කදුරුවැල්ල
කලුන්දාගෙදර
මයිල්ල
මකුල්ඔළුව
මැදගම ගෙදර
මොරන්කැලේ
නාගනේ
නෙත්තිපොල
පනාගමුව
පරකුඹුර
පන්අඹුව
පට්ටියගම
පිදිවිල්ල
රකව
සැවැන්දන
තම්මිට
උඩුගම
වැහැර

8–687—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

### 1972 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

#### 116 වන වගන්තිය යටතේ බලතල පැවරීමේ ආඥාව

වාරිමාර්ග, විදුලිබල සහ මහාමාර්ග ඇමති මෛත්‍රීපාල සේනානායක වන මම, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 116 වන වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පෙර පැවති පූර්ව රාජ්‍ය කොමිෂන් සභාව විසින් බලතල පවරා තිබුණු පරිදි, මෙම උපලේඛණයෙහි නිශ්චිතව සඳහන් දෙපාර්තමේන්තුවල සේවාවෙහි නියුක්ත ඒකාබද්ධ වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් වර්ෂයකට රු. 6,720 කට අඩු රාජ්‍ය නිලධාරීන්ගේ පත්වීම් පිළිබඳ සියළු බලතල 1972 මැයි මස 22 දින සිට වෙනයම් නැතහොත් තවදුරටත් විධිවිධාන යොදනු ලබන තෙක්, ඉහතකී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අදාල බලතල පැවරීමේ ආඥාවල සහ නීතිවල සඳහන් පරිදි, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එම වගන්ති සහ කොන්දේසි යටතේ, එසේන් එබඳු බලතල අමාත්‍ය මණ්ඩලය විසින් හෝ මා විසින් කලින් කලට නිකුත් කරනු ලැබිය හැකි උපදෙස්වලට අනුකූලව ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය යන කොන්දේසියට යටත්ව, එම රාජ්‍ය නිලධාරීන් වෙතම පවරා දෙනු ලැබූ බලතල ලෙස සැළකිය යුතුයයි නියෝග කරමි.

මෛත්‍රීපාල සේනානායක,
වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග ඇමති.

1973 ජූලි මස,
කොළඹ 1,
වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශයේදීය.

### උපලේඛනය

වාරිමාර්ග දෙපාර්තමේන්තුව
මහාමාර්ග දෙපාර්තමේන්තුව
ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව
රජයේ කර්මාන්තශාලාව
ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුව
ප්‍රාදේශීය වැඩ දෙපාර්තමේන්තුව, බටහිර දිසාව
ප්‍රාදේශීය වැඩ දෙපාර්තමේන්තුව, මධ්‍යම දිසාව
ප්‍රාදේශීය වැඩ දෙපාර්තමේන්තුව, නැගෙනහිර දිසාව
ප්‍රාදේශීය වැඩ දෙපාර්තමේන්තුව, දකුණු දිසාව
ප්‍රාදේශීය වැඩ දෙපාර්තමේන්තුව, උතුරු දිසාව
ප්‍රාදේශීය වැඩ දෙපාර්තමේන්තුව, වයඹ දිසාව
ප්‍රාදේශීය වැඩ දෙපාර්තමේන්තුව, උතුරු මැද දිසාව
ප්‍රාදේශීය වැඩ දෙපාර්තමේන්තුව, ඌව දිසාව
ප්‍රාදේශීය වැඩ දෙපාර්තමේන්තුව, සබරගමුව දිසාව.

8–693 — 73. 08. 17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

## 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත

### 67 (1) වන වගන්තිය යටතේ දැන්වීම

1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 67 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වැඩ බලන මුදල් අමාත්‍ය බර්නාඩ් සොයිසා වන මම, 1965 අගෝස්තු 27 දිනැති අංක 14,490 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද දැන්වීම, 'ලංකාවේ සානින් නෙත් මිදීමේ පදනම' සම්බන්ධයෙන් වූ කරුණ ඉවත් කිරීමෙන් එකී දැන්වීමේ උපලේඛනයෙහිලා මෙම දැන්වීම මගින් සංශෝධනය කරමි.

බර්නාඩ් සොයිසා,
වැඩ බලන මුදල් අමාත්‍ය.

1973 අගෝස්තු 6 දින,
කොළඹදීය.

8–691 — 73. 08. 17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

## 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත

### 16ඇ වන වගන්තිය යටතේ දැන්වීම

1969 අංක 6 දරන පන්තින් සංශෝධිත 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 16ඇ(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වැඩබලන මුදල් අමාත්‍ය බර්නාඩ් සොයිසා වන මම, ශ්‍රී ලංකා ජනරජයේ ආර්ථික ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය යයි කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යවරයා විසින් සලකනු ලබන ව්‍යාපාර වන මෙහි උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් නව කාර්මික ව්‍යාපාර, ඉහතකී වගන්තියේ කාර්යය සඳහා අනුමත ව්‍යාපාර වශයෙන්, කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යවරයාගේ ඉල්ලීම පරිදි මෙයින් ප්‍රකාශ කරමි.

බර්නාඩ් සොයිසා,
වැඩ බලන මුදල් අමාත්‍ය.

1973 අගෝස්තු 3 දින,
කොළඹ දී ය.

### උපලේඛනය

| කාර්මික යෝජනා ක්‍රමයේ විස්තරය | නව කාර්මික ව්‍යාපාරයේ නම |
|---|---|
| (1) රබර් මිශ්‍ර ආරක්ෂිත දැව නිමැ සහ වාර්නිෂ් වර්ග, රබර් මිශ්‍ර ඇනමල් ආරක්ෂිත ආලේප, රබර් මිශ්‍ර පායාස ආරක්ෂිත ආලේප. ... | සීමාසහිත ලංකා රෙසිනෝ ප්ලාස්ටික්ස් |
| (2) රෙයෝන් රෙදි සහ කෘත්‍රිම රෙදි ... | සීමාසහිත ක්ලීප්ටෙක්ස් ඉන්ඩස්ට්‍රීස් |
| (3) ලේස් රෙදි සහ දැල් රෙදි... | සීමාසහිත ලේස් ඉන්ඩස්ට්‍රීස් |

සටහන.—1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 16ඇ වන වගන්තිය යටතේ දීමනාවක් දෙනු ලබන්නේ 1973 මාර්තු 31 වන දින හෝ ඊට පෙර කරන ලද ආයෝජන සඳහා පමණී—1972 අංක 17 දරන දේශීය ආදායම් සංශෝධන පනතේ 6 වන වගන්තිය බලන්න.

8–692/1—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

## 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත

1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 10 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වැඩබලන මුදල් අමාත්‍ය, බර්නාඩ් සොයිසා වන මම, ශ්‍රී ලංකා ජනරජයේ ආර්ථික ප්‍රගතිය සඳහා අත්‍යාවශ්‍යයැයි කර්මාන්ත හා විද්‍යා කටයුතු භාර අමාත්‍යවරයා විසින් සලකනු ලබන යෝජනා ක්‍රමයක්වූ, මෙහිවූ උපලේඛනයෙහි නිශ්චිත නව කාර්මික ව්‍යාපාර ඉහතකී 10 වැනි වගන්තියේ (5) වැනි උපවගන්තියේ කාර්යයන් සඳහා අනුමත කළ යෝජනා ක්‍රම වශයෙන්, කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යවරයාගේ ඉල්ලීම පරිදි මෙයින් ප්‍රකාශ කරමි.

බර්නාඩ් සොයිසා,
වැඩ බලන මුදල් අමාත්‍ය.

1973 අගෝස්තු 3 වැනි දින,
කොළඹ දීය.

### උපලේඛනය

| කර්මාන්ත යෝජනා ක්‍රමයේ විස්තරය | නව කාර්මික ව්‍යාපාරයේ නම |
|---|---|
| (1) රබර් මිශ්‍ර ආරක්ෂිත දැව නිමැම් සහ වාර්නිෂ් වර්ග රබර් මිශ්‍ර ඇනමල් ආරක්ෂිත ආලේප, රබර් මිශ්‍ර පායාස ආරක්ෂිත ආලේප ... | සීමාසහිත ලංකා රෙසිනෝ ප්ලාස්ටික්ස්. |
| (2) සායම් සහ ඩිස්ටෙම්පර් සහ බුරුසු ... | සීමාසහිත හැරිස් (ලංකා). |
| (3) රෙයෝන් රෙදි සහ කෘතිම රෙදි ... | සීමාසහිත ක්ලීප්ටෙක්ස් ඉන්ඩස්ට්‍රීස්. |
| (4) ලේස් රෙදි සහ දැල් රෙදි ... | සීමාසහිත ලේස් ඉන්ඩස්ට්‍රීස්. |

8–692/2—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

## පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනයයි

(136 වැනි අධිකාරය වන) පඩි පාලක සභා ආඥා පනතේ 30 වැනි වගන්තිය යටතේ ගිනිපෙට්ටි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් කරන ලදුව, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් තීරණ කම්කරු ඇමතිවරයා විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29 (3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ තීරණ 1973 සැප්තැම්බර් 01 වැනි දින සිට වලංගු විය යුතුය.

ඇ. එ. ගෝගලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජූලි මස 31 දින,
කොළඹ දී ය.

### උපලේඛනය

ගිනිපෙට්ටි සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව 1947 මැයි මස 30 වැනි දින අංක 9,708 දරණ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කල වෙනස් කරන ලද්දාවූ ද තීරණ, එම උපලේඛනයෙහි IV වන කොටසෙහි "ආණ්ඩුවේ නිවාඩු දවස්" යන ශීර්ෂය යටතේ 1 වන ඡේදය වෙනුවට පහත දක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය :—

"ආණ්ඩුවේ නිවාඩු දවස් "

1. (අ) මේ ඡේදයේ සහ 2 වන ඡේදයේ විධිවිධානවලට යටත්ව සෑම සේවා යෝජකයෙකුම තමා . යටතේ සේවයෙහි

යොදවා සිටින සියලුම කම්කරුවන්ට 1971 අංක 29 දරන නිවාඩු පනතෙහි අර්ථානුකූලව පහත දැක්වෙන ආණ්ඩුවේ නිවාඩු දිනයන් පඩි සහිතව නිවාඩු දින වශයෙන් දිය යුතුය :—

(1) දෙමළ තෛපොන්ගල් දිනය ;
(2) සිංහල හා දෙමළ අළුත් අවුරුදු දිනට පෙරාතුවම වූ දිනය ;
(3) සිංහල හා දෙමළ අළුත් අවුරුදු දිනය ;
(4) මහ සිකුරාදා ;
(5) මැයි දිනය (මැයි 1) ;
(6) සිංහල වෙසක් මාසයේ පුර පසළොස්වක පොහෝ දිනයට ඉක්බිතිවම එළඹෙන දිනය ;
(7) ජනරජ දිනය (මැයි 22) ;
(8) බණ්ඩාරනායක ගුණානුස්මරණ දිනය (සැප්තැම්බර් 26) ;
(9) නත්තල් දිනය ;

(ආ) අනුඡේදයෙහි සඳහන් එක් එක් නිවාඩු දිනය වෙනුවෙන් කම්කරුවකුට ගෙවිය යුතු වේතනය, එම නිවාඩු දිනය යෙදුණු මාසයේ වැඩ කරන සාමාන්‍ය දිනක ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය විය යුතුය."

8-689—73. 08. 17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

## බන්ධනාගාර ආඥාපනත

### 35(1) වැනි වගන්තිය යටතේ නිවේදනය

(54 වැනි අධිකාරය වන) බන්ධනාගාර ආඥාපනතෙහි 35(1) වැනි වගන්තියෙන්, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමති, **පීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, කොළඹ නව මැගසින් බන්ධනාගාරය සඳහා ප්‍රාදේශීය පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන්**, 1973 අගෝස්තු මස 01 වැනි දින ආරම්භ වන එක් වර්ෂයක කාලයක් සඳහා, එච්. ඩබ්ලිව්. ධර්මදාස මහතා, පි. සමරනායක මහතා, ටී. සී. ජිනදාස මහතා සහ ඩී. එස්. රාජපක්ෂ මහතා මෙයින් පත් කරමි.

පීf. ආර්. ඩයස් බණ්ඩාරනායක,
අධිකරණ ඇමති.

1973 අගෝස්තු 4 දින,
කොළඹදී ය.

8-776—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

## 1970 අංක 33 දරන ශ්‍රී ලංකා රජයේ වාණිජ නීතිගත සංස්ථා පනත—28(1) වගන්තිය යටතේ ආඥාව

1970 අංක 33 දරණ ලංකා රජයේ වාණිජ නීතිගත සංස්ථා පනතේ 28 (1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, විදේශීය හා දේශීය වෙළඳ ඇමති ටිකිරි බණ්ඩා ඉලංගරත්න වන මම, ඉහතකී පනතේ 2 වන වගන්තිය යටතේ පනවන ලදුව 1972 පෙබරවාරි 8 වෙනි දින අංක 14,996/10 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද ආඥාවෙන් පිහිටුවන ලද ශ්‍රී ලංකා රජයේ වාණිජ (ඒකාබද්ධ අපනයන) නීතිගත සංස්ථාවේ කාර්යයන් සඳහා, මෙහිවූ උපලේඛණයෙහි නිශ්චිතව දක්වා ඇති, නිවේදිත දේපල නොවන නිශ්චල දේපල යෝජනා කරනලද පරිදි අත්කර ගැනීම මෙයින් අනුමත කරමි.

ටී. බී. ඉලංගරත්න,
විදේශීය හා දේශීය වෙළඳ ඇමති

1973 අගෝස්තු 3 දින,
කොළඹ දිය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ නගර සභා සීමාව තුළ මරදානේ පිහිටා ඇති, මරදාන ධර්මපාල මාවතේ වරිපනම් අංක 100 දරණ "මරන්දන් ගබඩාව" නමින් හැඳින්වෙන්නාවූද ප්‍රකට වූද ඉඩම් හා ගොඩනැගිලි වලින් බෙදූ කොටසක් වන, ආසන්න වශයෙන් අක්කර එකකුත් තුනෙන් පංගුව (අක්කර 1, 1/3) ක් යුත් ගබඩා වලිනුත්, ගොඩනැගිලි වලිනුත්, ඉඩමින් හා භූමි භාගයෙනුත් සමන්විත පහත සඳහන් මායිම් වලින් යුක්තවන කොළඹ නැ. පෙ. 91 දරණ සීමා සහිත මැක්වුඩ්ස් සමාගම විසින් අයිතිය කියා සිටිනු ලබන ඉඩම :—

උතුරට : ආනන්ද මාවතින්ද ;
නැගෙනහිරට : ධර්මපාල මාවතේ වරිපනම් අංක 100 "මරන්දන් ගබඩාව" නමින් හැඳින්වෙන දේපලින් ඉතිරි කොටසින්ද ;
දකුණට : ආනන්ද විද්‍යාලයීය භූමියෙන්ද
බස්නාහිරට : ආනන්ද විද්‍යාලයීය භූමියෙන්ද වේ.

8-618—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 (1), 3 (8) හා 4 (1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1970 දෙසැම්බර් මස 11 වැනි දින අංක 14,936 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි මුද්‍රා දැන්වීමේ උප ලේඛනයෙහි අංක 10 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි බටහිර කැඳැකෝරලේ ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනත්තන් මෙයින් පත් කරමි :—

(1) රඹෑව, රඹෑවගම පදිංචි මැණික්රාල විදානේගේ ජිනදාස මහතා.
(2) සාලියපුර, පහල ජනපදය, පාඩියන්කඩවල පදිංචි ගම්පත විදානරාලලාගේ මුදියන්සේ මහතා.
(3) සාලියපුර, ඉහල ජනපදය, පාඩියන්කඩවල පදිංචි වේලාතේගේ ජිනදාස මහතා.
(4) සාලියපුර, ඉහල ජනපදය, පාඩියන්කඩවල පදිංචි නයිදුරාලගේ උක්කුබණ්ඩා මහතා.
(5) සාලියපුර, පදිංචි දෙන් සෝමපාල රනතුංග මහතා.
(6) සාලියපුර පදිංචි අරුම පුරගේ සයිලස් ප්‍රනාන්දු මහතා.
(7) පරසන්ගහවැව, මාන්කඩවල පදිංචි බණ්ඩාගේ හේරත්හාමි මහතා.
(8) අනුරාධපුර, කුරුන්දන්කුලම ගොවි ජනපදය පදිංචි සමරකෝන් මුදියන්සේලාගේ අප්පුහාමි මහතා.
(9) අනුරාධපුර, කුරුන්දන්කුලම ගොවි ජනපදය පදිංචි වික්‍රමආරච්චිගේ පුංචි බණ්ඩා මහතා.
(10) අනුරාධපුර, කුරුන්දන්කුලම ගොවි ජනපදය පදිංචි දිනමුල්ල කන්කානමගේ චාර්ලිස් අප්පුහාමි මහතා.
(11) අනුරාධපුර, කුරුන්දන්කුලම මාතලේ පාර පදිංචි ටිකිරි බණ්ඩා සමරකෝන් මහතා.
(12) සාලියපුර, ජයන්ති ග්‍රාමය, බණ්ඩාරපුලියන්කුලම පදිංචි වර්ණකුලසූරිය ඇලෝසියස් ප්‍රනාන්දු මහතා.
(13) අනුරාධපුර, යාපනය පාර, පුලියන්කුලම පදිංචි විජේසුන්දර මුදියන්සේලාගේ ටිකිරි බණ්ඩා මහතා.
(14) අනුරාධපුර, යාපනය පාර, පුලියන්කුලම පදිංචි සේනක මුදියන්සේලාගේ පුංචිබණ්ඩා මහතා.
(15) සාලියපුර, ජයන්ති ග්‍රාමය, බණ්ඩාරපුලියන්කුලම පදිංචි ආරච්චිලාගේ පියදාස බණ්ඩා මහතා.
(16) රඹෑව, නාබඩගස්වැව පදිංචි සිරාලගේ අප්පුහාමි මහතා.
(17) රඹෑව, වහමල්ගොල්ලෑව පදිංචි හේරත්හාමිගේ කරුණාතිලක මහතා.

(18) මැදවච්චිය, සංගිලිකනදරාව පදිංචි කපුරාලගේ ජෝති පාල මහතා.

(19) රඹෑව, රඹෑව පදිංචි හේවාවැලිකඩගේ බැනි මහතා.

(20) රඹෑව, මාංකඩවල පදිංචි ලොකු පිටුම්පේ අප්පුහාමිලාගේ දෙන් හැක්ටර් විජේතුංග මහතා.

(21) මිහින්තලේ, මරදන්කුලම පදිංචි සංකපාල ආරච්චිගේ රිචට් දිසානායක මහතා.

(22) පරසන්ගස්වැව, රත්මලේ පදිංචි අප්පුරාලගේ විදානගේ පුංචි බණ්ඩා මහතා.

(23) මැදවච්චිය, පුල්එළිය පදිංචි පුංචිරාලගේ කිරාල මහතා.

(24) රඹකුලම, දිවුල්ලැව පදිංචි උක්කුබණ්ඩාගේ හේතුහාමි මහතා.

(25) රඹකුලම, බෙල්ලන්කඩවල පදිංචි පිංහාමිගේ කපුරාල මහතා.

(26) මැදවච්චිය, කලවැලපොතාන පදිංචි කිරිහාමිගේ රංගා මහතා.

(27) නේරියකුලම, නම්මැන්නා ඇලවක පදිංචි උක්කු බණ්ඩාගේ යසපාල මහතා.

(28) නේරියකුලම, නම්මැන්නා ඇලවක පදිංචි සිරාලගේ පුංචිරාල මහතා.

(ආ) රඹෑව, රඹෑවගම පදිංචි මැණික්රාල විදානේගේ ජිනදාස මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙසින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙසින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1973 අගෝස්තු මස 8 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

8–840/1—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

**සමගි මණ්ඩල පනත**

**ආඥාව**

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 (1), 3 (8) හා 4 (1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1970 දෙසැම්බර් මස 11 වැනි දින අංක 14,936 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 9 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි නැගෙනහිර කැඳෑ කෝරලේ ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙසින් පත් කරමි.

(1) අනුරාධපුරය, කැඳෑව උප තැපැල් කාර්යාලය හි උක්කු රාලගේ තිලකරත්න මහතා.

(2) කහටගස්දිගිලිය, පිනිබියගොල්ලෑව පදිංචි දිසානායක මුදියන්සේලාගේ බංඩාගේ සුගතපාල මහතා

(3) කහටගස්දිගිලිය, පිනිබියගොල්ලෑව පදිංචි ගොඩවත්ත ආරච්චිගේ බාර්ලිස් ද සිල්වා මහතා

(4) කහටගස්දිගිලිය, පිනිබියගොල්ලෑව, කිරිමැටියාව පදිංචි කන්දාවිදානෙගේ හේරත් මහතා

(5) පිනිබියගොල්ලෑව, තඹලගොල්ලෑව පදිංචි කන්දතේගේ පිකිරි අප්පු මහතා

(6) කහටගස්දිගිලිය, පිනිබියගොල්ලෑව, කිරිමැටියාව පදිංචි ජීවානයිදේගේ පොඩිඅප්පු මහතා

(7) රඹෑව, කල්ලන්චිය, ගෝනෑව පදිංචි මීල්ලපටබැඳිගේ මහතුන් මහතා

(8) රඹෑව, වලහහැංගුණුවැව පදිංචි හේතුහාමිගේ පුංචි බණ්ඩා මහතා

(9) රඹෑව, වම් ඉවුර, මහකනදරාව, යාය 2, නො. 155 හි පදිංචි තේවහාමි අප්පුහාමිගේ සෙනෙවිරත්න කුමාර සිංහ මහතා

(10) රඹෑව, වම් ඉවුර මහකනදරාව, යාය 2, නො. 156 හි පදිංචි සෙනෙවිරත්න මුදියන්සේලාගේ නන්දසේන කුමාරසිංහ මහතා

(11) අනුරාධපුරය, කැඳෑව පදිංචි තෙන්නකෝන් මුදියන්සේලාගේ මනතුංග මහතා

(12) රඹෑව, වම් ඉවුර, මහකනදරාව, යාය 2, නො. 114 හි පදිංචි සෙනෙවිරත් නමුදියන්සේලාගේ පුංචි බණ්ඩා මහතා

(13) රඹෑව, කල්ලන්චිය පදිංචි අප්පුහාමි වෙල්විදානේගේ උඩයාරේ මහතා

(14) මිහින්තලේ, මහකනදරාව, වම් ඉවුර, 53 හි පදිංචි ශ්‍රී නාරායන කපුරාලගේ කිරාල මහතා

(15) රඹෑව, කල්ලන්චිය පදිංචි අප්පුරාලගේ පුංචිබණ්ඩා මහතා

(16) රඹෑව, කල්ලන්චිය පදිංචි වලිසිංහ මුදියන්සෙලාගේ අප්පුහාමි මහතා

(17) රඹෑව, කල්ලන්චිය පදිංචි වන්නිහාමි වලිසිංහ මහතා

(18) කැඳෑව, කොනකුඹුක්වැව පදිංචි සිරාලගේ කදිරානේ මහතා

(19) අනුරාධපුරය, කැඳෑව පදිංචි පුංචිරාලගේ අප්පුහාමිගේ අබයකෝන් මහතා

(20) අනුරාධපුරය, කැඳෑව, ඇහැටුවාගම පදිංචි අප්පුරාල ලේකම්ගේ තේවාහාමි මහතා

(21) අනුරාධපුර, කැඳෑව, ගල්කඩවල පදිංචි පුංචිරාලගේ කදිරානේ මහතා

(22) රඹෑව, කල්ලන්චිය, නිඹිරිවැව පදිංචි ඩිංගිරාලගේ පුංචි රාල මහතා

(ආ) අනුරාධපුරය, කැඳෑව උප තැපැල් කාර්යාලයේ උක්කුරාලගේ තිලකරත්න මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙසින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවෙහි සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බවද මෙසින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1973 අගෝස්තු මස 8 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

8–840/2—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

**ධීවර ආඥාපණතේ (212 වැනි අධිකාරය) 20 (9) වැනි වගන්තිය යටතේ කෙරෙන නිවේදනයන්**

මග්ගොන උස්වැල්ල, ඉද්දපොල මාදැල් ධීවර ආරවුල

යථෝක්ත ධීවර ආරවුල පිළිබඳව විභාගයක් පවත්වා වාර්තා කිරීමට ගරු ධීවර ඇමතිතුමා විසින් පත් කරනු ලැබූ ඒ. එම්. අමීන් මහතාගේ වාර්තාව මහජනයාගේ දැන ගැනීම සඳහා ධීවර ආඥාපණතේ (212 වැනි අධිකාරය) 20 (9) වැනි වගන්තිය ප්‍රකාරව මෙසින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

2. මෙම ධීවර ආරවුලින් හෝ එයට අදාලවූ හෝ සම්බන්ධවූ හෝ එයින් පැන නගින්නාවූ හෝ කිසියම් කාරණයකින් ශිරිහැරයට පත් හා මෙම වාර්තාවේ දක්වා ඇති කිසියම් කරුණක් සම්බන්ධයෙන් හෝ කරුණු පැල කර සිටීමට කැමති යම් අයෙකු වේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන දිනයේ සිට මාසයක් ඉකුත්වීමට පෙර ධීවර ඇමතිතුමා වෙත ලියවිල්ලකින් එම කරුණු ඉදිරිපත් කළ යුතුය.

ඊ. පී. ගුණවර්ධන,
ධීවර අමාත්‍යාංශයේ ලේකම්.

1973 අගෝස්තු මස 6 දින,
කොළඹ දී ය.

(ආ) එස්. එල්. පෙරේරා ගේ පුත්‍රයා වන —එස්. වී. එල්. පෙරේරා

(ඇ) එස්. ඊ. සී. පෙරේරාගේ පුත්‍රයා වන—එස්. වී. එන්. පෙරේරා

යන අය මේ වැඩ පිළිවෙළ සඳහා පිළි ගනු ලැබේ.

5. මෙම වැඩ පිළිවෙලෙහි කාර්යයන් සඳහා වර්ෂයක් වශයෙන් සැලකෙන්නේ සැප්තැම්බර් මස 1 දිනෙන් ඇරඹෙන මාස 12 ක කාල සීමාවකි.

6. ඉද්දපොළ වරායෙහි :—

(ඒ) සෑම මාසයකම ඔත්තේ දින වලදී, එනම් 1, 3, 5 වැනි දින වලදී පෙරේරා සොහොයුරන් කණ්ඩායමට පහත 6 (බී) ඡේදයෙහි විස්තරකොට දක්වා ඇති පිළිවෙලට මාදැල් මගින් මසුන් ඇල්ලීමට අයිතිය හිමිවන අතර මේ අයුරින්ම ඇන්ඩෲ සොහොයුරන් කණ්ඩායමට සෑම මාසයකම ඉරට්ටේ දිනවලදී එනම්, 2, 4 හා 6 වැනි දිනවලදී මාදැල් මගින් මසුන් ඇල්ලීමට අයිතිය හිමිවේ.

(බී) ඉහත 6 (ඒ) ඡේදයෙන් පෙරේරා සොහොයුරන් කණ්ඩායමට මසුන් ඇල්ලීම සඳහා නියම කර ඇති ඔත්තේ දින වලදී මසුන් ඇල්ලීම කළ යුත්තේ ඉහත 4 වැනි ඡේදයෙහි පිළිගනු ලැබ සිටින පුද්ගලයන් තිදෙනා විසින් පහත දැක්වෙන ක්‍රමය අනුවය.

එනම් :—එස්. ජී. බී. පෙරේරා—1 වැනි දින.
එස්. වී. එල්. පෙරේරා—3 වැනි දින.
එස්. වී. එන්. පෙරේරා—5 වැනි දින.

යනාදි වශයෙන් මාරුවෙන් මාරුවටය.

7. උස්වැල්ල වරායෙහි :—

(ඒ) සෑම මාසයකටම ඉරට්ටේ දිනවලදී, එනම් 2, 4, 6 වැනි දින වලදී පෙරේරා සොහොයුරන් කණ්ඩායමට පහත 7 (බී) ඡේදයෙහි විස්තර කොට දක්වා ඇති පිළිවෙලට මාදැල් මගින් මසුන් ඇල්ලීමට අයිතිය හිමිවන අතර මේ අයුරින්ම ඇන්ඩෲ සොහොයුරන් කණ්ඩායමට සෑම මාස යකම ඔත්තේ දිනවලදී එනම් 1, 3, 5 වැනි දිනවලදී මාදැල් මගින් මසුන් ඇල්ලීමට අයිතිය හිමිවේ.

(බී) ඉහත 7 (ඒ) ඡේදයෙන් පෙරේරා සොහොයුරන් කණ්ඩායමට මසුන් ඇල්ලීම සඳහා නියම කර ඇති සෑම මාසයකම ඉරට්ටේ දිනවලදී මසුන් ඇල්ලීම කළ යුත්තේ ඉහත 4 වැනි ඡේදයෙහි පිළිගනු ලැබ සිටින පුද්ගලයන් තිදෙනා විසින් පහත දැක්වෙන ක්‍රමය අනුවය.

එනම් :—එස්. ජී. බී. පෙරේරා—2 වැනි දින.
එස්. වී. එල්. පෙරේරා—4 වැනි දින හා
එස්. වී. එන්. පෙරේරා—6 වැනි දින

යනාදි වශයෙන් මාරුවෙන් මාරුවටය.

8. 31 වැනි දිනෙන් අවසන් වන මාසයක හා අධික අවුරුද්දක පිට පිටම ඔත්තේ දින දෙකක් පැමිණියේ වී නමුදු එබඳු වාසියක් පක්ෂ දෙකටම ලැබෙන බැවින් ඉහත දක්වා ඇති දැල් වාර (බදු) වෙන් කර තිබීම එලෙසින්ම පවතිනු ඇත.

9. ඉහත දක්වා ඇති පරිදි මසුන් ඇල්ලීම සඳහා අයිතිය හිමිවන ඕනෑම පුද්ගලයෙකු විසින් එම අයිතිය ක්‍රියාවේ යෙදවිය යුත්තේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කල ධීවර යාත්‍රාවක් හා අවශ්‍ය මාදැලක් තමන්වෙත සපයා ගැනීමෙනි.

10. ඉහත සඳහන් විධිවිධාන යටතේ යම් පුද්ගලයෙකුට මේ වාරයක මසුන් ඇල්ලීම සඳහා නියම් කර ඇති දිනයකදී ඔහුට එකී දිනයේ සම්පූර්ණයෙන්ම හෝ ඕනෑම වේලාවක හෝ මසුන් ඇල්ලීම කළ හැකිය.

11. ඇන්ඩෲ සොහොයුන් සහ/හෝ ඔවුන්ගේ දරුවන් අතර කිසියම් ආරවුලක් පැන නැගුනහොත් පෙරේරා සොහොයුරන් සම්බන්ධයෙන් අදාල විධි විධායන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඔවුන් කෙරෙහිද බල පැවත්වෙනු ඇත.

විභාගයේදී මට සහාය දුන් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හා නොයෙකුත් කරුණු පැහැදිලි කර ගැනීමට ආධාර කළ නීතිඥ මහතුන්ටද මගේ ස්තුතිය පිරිනමමින් මෙම වාර්තාව අවසන් කරමි.

ඒ. එම්. අමීන්,
කොමසාරිස්.

1973. 02. 17.

බේරුවල, බේරුවල ධීවර කාර්මිකයන්ගේ සමුපකාර සමිතියේ දී 1973. 02. 17 දින කොමිෂම රැස්වූ අවස්ථාවේදී පැමිණ සිටි ඒ ඒ පාර්ශ්ව කරුවන් ඉදිරියේ මා විසින් මෙම වාර්තාව කියවා පැහැදිලි කර දෙන ලද අතර එය සිංහලටද පරිවර්තනය කර කියවන ලදී.

ඒ. එම්. අමීන්,
කොමසාරිස්.

1973. 02. 17.

8–663—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

## තානායම් පනත

අංක 64 සහ 1973 ජූනි මස 14 දින හා අංක 42 සහ 1973 ජනවාරි මස 12 වැනි දින දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රවල පළකරන ලද දැන්වීම් වලින් සංශෝධිත අංක 37 සහ 1972 දෙසැම්බර් 8 දින දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළකර ඇති තානායම් රීති පහත සඳහන් පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

එහි උපලේඛනයේ "නවාතැන් ගාස්තු" යටතේ සඳහන් වන (1 වන) උප ඡේදයේ අගට පහත සඳහන් වාක්‍යය අභිනවයෙන් එක් කිරීමෙන් :

"තානායමේ නවාතැන් ගනු ලබන එහෙත් තානායමෙන් ආහාර පාන කිසිවක් නො ගන්නා අමුත්තන් විසින් නවාතැන් ගාස්තු (කාමර කුලිය) වලට අමතරව එක් අයකු සඳහා රු. 2 ක බැගින් ගාස්තුවක් ගෙවිය යුතුය."

යථෝක්ත සංශෝධනය රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් අනුමත කර ඇති අතර, එය 1973 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වනු ඇත.

ඩී. එච්. සිරිවර්ධන,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

1973 අගෝස්තු 8 දින,
කොළඹ දී ය.

8–789—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

## 1972 අංක 7 දරණ ගෙවල් කුලී පනත

1972 අංක 7 දරණ ගෙවල් කුලී පනතේ 2(1) (ආ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නිවාස හා ගොඩනැගිලි ඇමති, පීටර් ජෙරල්ඩ් බර්තොලමියුස් කෙනමන් වන මම මෙම නිවේදන යෙන් :—

(අ) මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් එක් එක් ප්‍රදේශය, ඉහත සඳහන් පනත ක්‍රියාත්මක විය යුතු ප්‍රදේශයක් ලෙස ප්‍රකාශ කරමි. තවද,

(ආ) මෙම නිවේදනය ගැසට් නිවේදනයේ පල වන දිනය, මෙම නිවේදනය වලංගු විය යුතු දිනය වශයෙන් නියම කරමි.

පී. ජී. බී. කෙනමන්,
නිවාස හා ගොඩනැගිලි ඇමති.

1973 ජූලි මස 27 දින,
කොළඹදී ය.

### උපලේඛනය

1. හලාවත දිස්ත්‍රික්කයේ මැද පළාත ගම් සභාවේ පරිපාලන සීමාවන් ඇතුළත වූ ප්‍රදේශය.

2. හලාවත දිස්ත්‍රික්කයේ යටකලන් පත්තු ගම් සභාවේ පරිපාලන සීමාවන් ඇතුළත වූ ප්‍රදේශය.

3. හලාවත දිස්ත්‍රික්කයේ වෙන්නප්පුව සුළු නගර සභාවේ පරිපාලන සීමාවන් ඇතුළත වූ ප්‍රදේශය.

4. හලාවත දිස්ත්‍රික්කයේ කම්මල් පත්තු ගම්සභාවේ පරිපාලන සීමාවන් ඇතුළත වූ ප්‍රදේශය.

8–737—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

අංක : ට්. 23/කො. 57/67.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් පනත (විශේෂ විධිවිධාන) සමඟ කියැවෙන) දරන (සංශෝධිත) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 1969 ජූලි මස 25 දින අංක 14,864 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1969 ජූලි මස 11 වන දින දරන නියෝගයෙන් කොළඹ 2, යූනියන් පෙදෙසේ, අංක 135 හි එම්. පිලිප් මහතා සහ කොළඹ 14, ග්‍රෑන්ඩ්පාස් පාරේ, අංක 257, සීමාසහිත එම්. එස්. හෙබ්තුල්ලා බෝයි සහ සමාගම, අතර ඇති 1969 ජූලි මස 3 දින දරන ආරවුල පිළිබඳව වැඩබලන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳ වූ කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථය කිරීම සඳහා කොළඹ 12, හල්ස්ඩොෆ් වීදියේ, අංක 115 හි එම්. ඩබ්ලිව්. පෙරේරා මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළ යුතුයැයි දැන් පෙනියන හෙයින්, කම්කරු ඇමති වන මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, එකී නියෝගය අවලංගු කරන අතර, එකී 1969 ජූලි මස 11 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 ජූලි මස 30 දින,
කොළඹ දීය.

8–620/1—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

අංක : ට්. 23/කො. 157/67.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම්තකර දක්වා ඇති කාරණය පිළිබඳව එම්. පිලිප් මහතා, 356, යූනියන් පෙදෙස, කොළඹ 2, සහ එම්. එස්. හෙබ්තුල්ලාබෝයි ඇන්ඩ් කොම්පැනි ලිමිටඩ්, 257, ග්‍රෑන්ඩ්පාස් පාර, කොළඹ 14, අතර කාර්මික ආරවුලක් පවතින හෙයින්ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, නුගේගොඩ, පාගොඩ පාරේ අංක : 18 හි පදිංචි ජේ. පී. එල්. ස්වාරිස් මහතා වෙත මෙයින් යොමුකරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 ජූලි මස 30 දින,
කොළඹ දීය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත**

එම්. පිලිප් මහතා, 356, යූනියන් පෙදෙස, කොළඹ 2

සහ

එම්. එස්. හෙබ්තුල්ලාබෝයි ඇන්ඩ් කොම්පැනි ලිමිටඩ්,
257, ග්‍රෑන්ඩ්පාස් පාර, කොළඹ 14.

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

**ආරවුලට හේතුව් පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය**

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ, කොළඹ, එම්. එස්. හෙබ්තුල්ලාබෝයි ඇන්ඩ් කොම්පැණි ලිමිටඩ් හි පාලක පක්ෂය විසින් එම්. පිලිප් මහතාට 1965/66 වර්ෂය සඳහා ප්‍රසාද මුදල් නොගෙවීම යුක්තිසහගතද යන්නත් සහ පිලිප් මහතාට කුමන සහනයක් හිමිද යන්නත් පිළිබඳව වේ.

1973 ජූලි මස 24 වැනිදා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දිනා යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

8–620/2—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

අංක ඩබ්. 105/1176.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවසථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් පනත (විශේෂ විධිවිධාන) සමඟ කියැවෙන) දරන (සංශෝධිත) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 1973 ජනවාරි මස 12 දින අංක 42 ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1972 දෙසැම්බර් මස 28 වන දින දරන නියෝගයෙන් එක් පාර්ශවයක් වශයෙන් මහනුවර කන්දේ වීදියේ අංක 13 හි ලංකා වතු සේවා සංගමය සහ අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 3, ගාලු පාරේ අංක 265 හි මොරපාන කොමර්ෂල් කොම්පැණි ලිමිටඩ් බාරේ ලිඳුල, මැක්ඩෆ් වත්තේ අයිතිකරුවන් වන පර්සි ට්. ප්‍රනාන්දු මහතා සහ ඇස්. සී. ප්‍රනාන්දු මහත්මිය, අතර ඇති 1972. 12. මස 16 දින දරන ආරවුල පිළිබඳ කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳ වූ කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථය කිරීම සඳහා කම්කරු විනිශ්චය සභා අංක X හැටන් වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළ යුතුයැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු ඇමති වන මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, එකී නියෝගය අවලංගු කරන අතර, එකී 1972 දෙසැම්බර් මස 28 වන දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන
කම්කරු ඇමති.

1973 අගෝස්තු මස 02 වන දින,
කොළඹ දීය.

8–685/1—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

අංක ඩබ්. 105/1176.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධන මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිතකර දක්වා ඇති කාරණය පිළිබඳව මහනුවර, කන්දේවීදියේ අංක 13 හි ලංකා වතු සේවා සංගමය එක් පාර්ශ්වයක් වශයෙන් ද, සහ අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 3, ගාලු පාරේ අංක 265 හි මොරපාන කොමර්ෂල් කොම්පැණි ලිමිටඩ් සහ ලිදුල, මැක්ඩ්ෆ් වත්තේ වතු අධිකාරි, අතර කාර්මික ආවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කම්කරු විනිශ්චය සභා අංක X ගැටන් වෙත මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 අගෝස්තු මස 02 දින,
කොළඹ දීය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත**

මහනුවර, කන්දේවීදියේ අංක 13 හි ලංකා වතු සේවා සංගමය
එක් පාර්ශවයක් වශයෙන් ද

සහ

අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 3, ගාලු පාරේ අංක 265 හි මොරපාන කොමර්ෂල් කොම්පැණි ලිමිටඩ් සහ ලිදුල, මැක්ඩ්ෆ් වත්තේ වතු අධිකාරී
අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

**ආරවුලට හේතුව පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය**

ඉහත සඳහන් පාර්ශවයන් අතර ආරවුලට හේතුවී ඇති කරුණු වනුයේ, ඉහත සඳහන් කරන ලද වෘත්තිය සමිතියේ සාමාජිකයෙක් වන, ලිදුල මැක්ඩ්ෆ් වත්තේ පාලක පක්ෂය විසින් 1965 ඔක්තෝබර් 25 වන දින සිට 1971 අප්‍රේල් 26 වන දින දක්වා ගුරුවරයෙකු/ලිපිකරුවෙකු වශයෙන් සේවයේ යොදවා සිටි එස්. සෙල්වරත්නම් මහතාට ප්‍රමාණවත් වේතන ගෙවන ලද්දේද යන්නත්, එසේ නොගෙවා ඇත්නම් ඔහුට කුමන සහනයක් හිමිද යන්නත් පිළිබඳව වේ.

1973 ජූලි මස 18 වැනිදා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොසාරිස්.

8–685/2—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

අංක ටී. 23/කො. 558/72.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව එක් පාර්ශවයක් වශයෙන් සී. බී. ඇල්. ජයසිංහ මහතා, "සුරනිමල්", අංක 14, කාසියා මාවත, ගල්කිස්ස සහ අනික් පාර්ශ්වය වශයෙන් (1) අස්ගර් අබ්දුල් හුසේන් ජැපර්ජී, අංක 11, බගතලේ පාර, කොළඹ 5, (2) සලේ අබ්දුල් හුසේන් ජැපර්ජී, අංක 11/1, බගතලේ පාර, කොළඹ 5, (3) අබිඩ් අබ්දුල් හුසේන් ජැපර්ජී, අංක 11/2, බගතලේ පාර කොළඹ 5 සහ (4) තුරාබ් අබ්දුල් හුසේන් ජැපර්ජී, අංක 24, සැන්ට් කිල්ඩාස් ලේන්, කොළඹ 3 යන මහත්වරු, කොටස්කරුවන්, අබ්දුල් හුසේන් ජැපර්ජී ආයතනය, අංක 279, වුල්ෆැන්ඩල් වීදිය, කොළඹ 13 අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙරකදෝරු, ගම්පහ, ප්‍රජාපාල ශ්‍රී ගුණවර්ධන මහතා වෙත මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 අගෝස්තු මස 02 දින.
කොළඹදී ය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත**

එක් පාර්ශවයක් වශයෙන් සී. බී. ඇල්. ජයසිංහ මහතා,
"සුරනිමල්", අංක 14, කාසියා මාවත, ගල්කිස්ස

සහ

අනික් පාර්ශවය වශයෙන් (1) අස්ගර් අබ්දුල් හුසේන් ජැපර්ජී, අංක 11, බගතලේ පාර, කොළඹ 5, (2) සලේ අබ්දුල් හුසේන් ජැපර්ජී, අංක 11/1, බගතලේ පාර, කොළඹ 5 (3) අබිඩ් අබ්දුල් හුසේන් ජැපර්ජී, අංක 11/2, බගතලේ පාර, කොළඹ 5, සහ (4) තුරාබ් අබ්දුල් හුසේන් ජැපර්ජී, අංක 24, සැන්ට් කිල්ඩාස් ලේන්, කොළඹ 3 යන මහත්වරු, කොටස්කරුවන්, අබ්දුල් හුසේන්, ජැපර්ජී ආයතනය, අංක 279, වුල්ෆැන්ඩල් වීදිය, කොළඹ 13

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

**ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය**

"ඉහත සඳහන් පාර්ශවයන් අතර ආරවුලට හේතුවී ඇති කරුණු නම් :—

(1) අබ්දුල් හුසේන් ජැපර්ජී ආයතනයේ පාලක පක්ෂය විසින් සී. බී. ඇල්. ජයසිංහ මහතාගේ සේවය අවසන් කිරීම යුක්ති සහගතද යන්නත්, සී. බී. ඇල්. ජයසිංහ මහතාට කුමන සහනයක් හිමිද යන්න,

සහ

(2) සී. බී. ඇල්. ජයසිංහ මහතාගේ සම්පූර්ණ සේවා කාලය තුළම ඔහුට ගෙවිය යුතු වේතනයෙන් හා දීමනාවන්ගෙන් යම්කිසි මුදල් ප්‍රමාණයක් මාණ්ඩලික ඉතුරු කිරීමේ ක්‍රමයක් සඳහා අබ්දුල් හුසේන් ජැපර්ජී ආයතනයේ පාලක පක්ෂය විසින් රඳවා ගන්නා ලද්දේ ද යන්න සහ සී. බී. ඇල්. ජයසිංහ මහතාට කුමන සහනයන් හිමි ද යන්නත් පිළිබඳව වේ.

1973 ජූලි මස 27 වැනිදාවූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

8-739—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**1959 අංක 5 දරණ (සංශෝධන) පනතින් සංශෝධිත 1941 අංක 30 දරන ණය සහනදයක ආඥපනත**

1959 අංක 5 දරන (සංශෝධන) පනතින් සංශෝධිත 1941 අංක 39 දරන ණය සහනදයක ආඥපනත යටතේ පහත දක්වෙන උපලේඛනයේ අංක 1 සහ 2 යන ශීර්ෂයන්හි දක්වෙන ණයකරුවන් හා ණයහිමියන් යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරිමට ණය සහනදයක මණ්ඩලය අදහස් කර ඇත.

මේ සඳහා ඒ ඒ ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණය පිළිබඳ විස්තර ප්‍රකාශයක් 1973 අගෝස්තු මස 22 වෙනි දිනට පෙර මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස ණයහිමියන්ට මෙයින් දන්වනු ලැබේ.

කේ. ඒ. ඩී. බී. කරුණාරත්න,
ණය සහනදයක මණ්ඩලයේ ලේකම්.

කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ,
අංක 33/1, ''අමිරා'' දරණ ස්ථානයේ පිහිටි,
ණය සහනදයක මණ්ඩලිය දෙපාර්තමේන්තුවේදීය.
1973.07.31

උපලේඛනය

| ඉල්ලුම්පත් අංකය | අංක 1 — ණයකරුගේ නම සහ ලිපිනය | අංක 2 — ණයහිමිගේ නම සහ ලිපිනය |
|---|---|---|
| 26652 | තෙංගලදේවගේ හර්මානිස් ප්‍රනාන්දු, වදුරාගොඩ, දිනිමිනියාතැන්න, දෙඩන්ගස්ලන්ද | පාඩිගමගේ සෝමවතී, වදුරාගොඩ, දිනිමිනියාතැන්න, දෙඩන්ගස්ලන්ද |
| 26654 | මීමුර දිසානායක මුදියන්සේලාගේ පලිහුමැණිකේ දිසානායක, අම්බලියද්ද, හපුවෙල, හඟුරන්කෙත | මල්වත්ත මොහොට්ටිගේ සුසිල් නැතහොත් ඇස්. ඇම්. මොහොට්ටි. මොලමුරේ, බෝමුරේ, මැදමහනුවර |
| 26655 | බී. පී. සමරදිවාකර, වැලිගල්ල, දෙරවක | වීරගමගේ මුණසිංහ සහ කාරන්විදේවගේ චාර්ල්ස් ගුණරත්න, නැවිගල, දන්ඔවිට |
| 26657 | කොටවිල ජෝන් විතානගේ, අංක 121, වැවල, පිළියන්දල | ඇල්. ජේ. බී. ද සිල්වා—ග්‍රේස් ද සිල්වා අංක 4, පැපින් පටුමග, බම්බලපිටිය |
| 26658 | වෙල්ලගේ නැතැනියෙල් ප්‍රනාන්දු, 7ඒ, පැලවත්ත පාර, නුගේගොඩ | ඊ. ඇජ්. එච්. පීරිස්, අංක 3, අංක එකේ තට්ටු නිවාසය, බම්බලපිටිය |
| 26660 | අන්නම්මා රාජරත්නම්, අංක 4, කට්පගවිනායාගාර් වීදිය, චුන්ඩිකුලි, යාපනය | කේ. කදිරවේලු, අංක 608, කේ. කේ. ඇස්. පාර, යාපනය |
| 26661 | ප්‍රැන්සිස් රත්නායක සහ ඉන්ද්‍රායසවතී අබේසේකර, දීයගහ, නාවිමන, මාතර | දෝන සෝමවතී රත්නායක, හේනෙවත්තහේන, දීයගහ, නාවිමන |
| 26663 | යූ. ඩේවිඩ් සිල්වා, අංක 240, වඩුමුල්ල, වතුගෙදර | වීරකොන්ඩ ආරච්චි පේමවතී, මහලදූව, බලපිටිය |
| 26668 | තම්බු නල්ලයියා, නුනාවිල් බටහිර–චාවාකච්චේරි | රත්නවඩිවේලූකමලාවතී, නුනාවිල් බටහිර–චාවාකච්චේරි |
| 26669 | ඩබ්ලිව්. ඩී. අශෝකා රංජනී, 137, ගොඩවෙල, පොල්ගහවෙල | ඩබ්ලිව්. ඇම්. හින්නිමහත්මයා, බන්දව–පොල්ගහවෙල |
| 26671 | වන්නිආච්චිගේ පුංචි මහත්මයා වන්නිඅච්චි නොහොත් වන්නි ආරච්චි, 459, අකුරෙගම, දකුණු තලංගම, තලංගම | තොන්ඩුවලාගේ ඇලිස්නෝනා, යෝගම රබර් කඩේ බාරේ, යෝගම, දෙහිඕවිට |
| 26672 | කහදවල ආරච්චිගේ සෝමපාල, 461, බියගම, මල්වාන | හබරගමුව කෝරලගේ රොමානිස් සිංඤෝ, 598/1, සහබෝ මාවත මාකොල, කඩවත උතුර |
| 26673 | චාර්ලිනා වික්‍රමසේකර, වෙහෙරහේන පාර, වෙහෙල්ගොඩ, මාතර | ඩබ්. ඩබ්. එච්. පී. ගිල්ප්‍රඩ් සිල්වා, 360, ''රත්න'' මහවීදිය, වැලිගම, |
| 26674 | බාලසුබ්‍රමානියම් සුන්දර රාජා සහ රාසමනී, 45, ග්‍රීන් ලේන්, කොට හේන, කොළඹ 13 | කනගලිංගම් රාසලිංගම් තුරෙයිරත්නම්, යාල් හාල් මෝල, ඉනුවිල් පාර, මනිපායි |
| 26675 | 1. ඩී. ඩී. ඇලිස්නෝනා<br>2. පී. ජයරත්න පෙරේරා<br>3. පී. සෝමරත්න පෙරේර<br>4. පී. විල්සන් පෙරේරා<br>5. පී. සිරියාවතී පෙරේරා<br>82, කිත්තම්පාහුව, වැල්ලම්පිටිය | කේ. කේ. ජී. රිචඩ්, ස්වදේශීය වෙළඳ සැල, වැල්ලම්පිටිය |
| 26677 | ගිරිගමු මුහන්දිරමලාගේ පුංචිනයිදේ, පට්ටලේ ගෙදර, නරමාන | 1. ජයසිංහ ආරච්චිගේ ජෝන් සිංඤෝ, කොහුමෝල, බෝගොඩ, නරමාන<br>2. ටී. ඇස්. සෙල්ලප්පු, මඩාටුව, නරමාන |
| 26678 | බමුනුගෙදර ගල්ලද්දලාගේ ඩිංගිරිහාමි නාච්චිරේ, පට්ටලේගෙදර–නරමාන | 1. ජයසිංහ ආරච්චිගේ පුෂ්පා වලයට්, බෝගොඩ කොහුමෝල, නරමාන<br>2. ජයසිංහ ආරච්චිගේ ජෝන් සිංඤෝ, බෝගොඩ කොහුමෝල, නරමාන |
| 26680 | අළුතපොල රාල්ලාගේ මාර්තාහාමි, දළුපොතවත්ත–ගිරිඋල්ල | ඒ. ආර්. බෙලින් සිංඤෝ, දළුපොත වත්ත, ගිරිඋල්ල |
| 26681 | මුදුන්මිනි සුමනායගම් මුහන්දිරමලාගේ ඩේවිඩ්, 21, මඩවල, බසාර්, මඩවල | 1. නාපාන දවුන්ඩපටබැන්දලාගේ සමනලකුඹුරේ ගෙදර ඩිංගිරි අම්මා, 73, රාගල පාර, තෙල්දෙණිය<br>2. වැකොලදෙනියේ නල්ලපෙරුමාල් පණ්ඩිතරත්න මුදලිගමලත්ගේ විස්වකුල නිමලාවතී පණ්ඩිතරත්න, පි. පී. ඇම්. යසපාල බාරේ, මහජන සෞඛ්‍ය පරීක්ෂක තැන, ගම්පල නගර ශාඛාව, ගම්පළ |
| 26683 | පතිරගේ අමරදස පෙරේරා, 83, ගොඩිගමුව, මහරගම | කනන්ගේ තේමිස් පෙරේරා, වැවපාර, බොරලැස්ගමුව, මහරගම |
| 26684 | ලීලාවතී යෙනෙවිරත්න, 31/3, සමරනායක පාර, කොළොන්නාව වැල්ලම්පිටිය | 1. සී. ආරියදස සිල්වා<br>2. සී. විමලාවතී සිල්වා, (3) සී. ස්වර්නා සිල්වා, 19/5, දෙමටගොඩ පෙදෙස, කොළඹ 9 |
| 26685 | ඩී. ඒ. මැන්දිස් නොහොත් ඩී. පොඩිනෝනා ද සිල්වා කොරනර් රාලහාමි බාරේ, රණපනාදෙණිය, දෙඩන්දූව | මේරි මාටින් සිල්වා, රත්ගම හන්දිය, දෙඩන්දූව |
| 26686 | සේනානායක නාවිලගේ දෙන් පියසේන, නො. 113, මහවිල, පානදුර | ගින්තොට විදනලාගේ විල්බට් සිල්වා හෙවත් ගින්තොටවිදනෙලාගේ සිමියොන් සිල්වා, 20, පොන්සේකා පෙදෙස, කළුතර උතුර, කළුතර |

| ඉල්ලුම්පත් අංකය | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමිගේ නම සහ ලිපිනය |
|---|---|---|
| 26688 ... | වතවන විතාන වසම් ජයසේන, 184, කෙලින්වීදිය, බත්තරමුල්ල ... | වතවන විතාන වසම් ලීලාවතී නොහොත් ජයසේකර, "කුඩ කෙකඩේ" පෝරඹ කනක්කෙ, කනක්කෙ–ඉමදූව |
| 26689 ... | මාතරකිරිලියනගේ ඇන්ගස් ප්‍රනාන්දු, නගර සභා ක්‍රීඩා පිටිය අසල, කොච්චිකඩේ | මඩිගපොලලේකම්ගේ සිරිල් පොන්සේකා, දළුවාකොටුව, කොච්චිකඩේ |
| 26690 ... | ඇම්. පියදස, 94, ගෝතමී පාර, බොරැල්ල ... | සීමාසහිත ස්ටැන්ඩඩ් ඉන්ෂුවරන්ස් සමාගම, 39, වැතැම් වීදිය කොළඹ |
| 26691 ... | එච්. ඒ. ඩබ්. ඩී. ඩිංගිරි අම්මා, හරිස්ගම, 588, බණ්ඩාරනායක මාවත, මාතලේ | අනුලා තල්ගහගොඩ ඒකනායක කුමාරිහාමි, හරස්ගම, මාතලේ |
| 26692 ... | අළුත්වත්තගේ සැමියන් සිල්වා, සාරිගේවත්ත-කප්පරතොට, වැලිගම | කරුණාවතී වික්‍රමසූරිය, වික්‍රමසූරිය බාරේ, බලයල ක් මිනිදෝරු තැන, සාරිගේවත්ත, කප්පරතොට, වැලිගම |
| 26694 ... | කේ. ජෝන් සිංඤෝ, කේ. දෝන පුංචිනෝනා, කේ. කර්ලිනාහාමි නොහොත් දෙන් කර්ලිනාහාමි, ඉද්දගොඩ,මතුගම | ගල්පායගේ දෙන් පීටර්, ඉද්දගොඩ–මතුගම |
| 26697 ... | ආරුමුගම් කදිරවේලු සහ නාගම්මා, අරලි බටහිර, වඩ්ඩුකොඩ්ඩෙයි ... | වීරසිංහම් නඩරාජා සහ නඩරාජා දේවකඩාවම්, අරලි බටහිර, වඩ්ඩුකොඩ්ඩෙයි, යාපනය |
| 26698 ... | මානික්කුගේ සෝමවතී ද සිල්වා, මඩවල, මිනුවන්ගොඩ ... | මානික්කුගේ නමදවතී ද සිල්වා, මඩවල–මිනුවන්ගොඩ |
| 26699 ... | මහිපාල මුදලිගේ සිල්වෙස්ත්‍රි පාරිස්, නො. 17, ඒත්තුකාල, මීගමුව ... | මිහිඳුකුලසූරිය මේරි එලිසබෙත් රීටා පිංතු, 41, සාන්ත ජෝශප් පාර, ඒත්තුකාල, මීගමුව |
| 26700 ... | හෙනරත් ආරච්චිගේ දෙන් සයිමන් අප්පුහාමි (මියගොස්), කනකසේකර ආරච්චිලාගේ දෝන මාර්තිනා හාමිනේ, බොරගොඩ වත්ත, මිනුවන් ගොඩ | 1. ජයසිංහ ආරච්චිගේ ස්ටීවන් පෙරේරා, (2) ජයසිංහ ආරච්චිගේ පද්මා ජයසිංහ මැණිකේ, බොරගොඩ වත්ත, මිනුවන්ගොඩ |
| 26701 ... | ඒ. ඕ. ඇම්. ෂරීප්, 83, මහවීදිය, අංකුඹුර ... | හේවගේ රොසලින්, මාදුරේ කෝරළේ, ගෝනිගොඩ, පිහිඹුව |
| 26703 ... | මොහිදීන් බාවා, පොඩිසෙයිනම්බු, අලි පටුමග, සම්මන්තුරෙයි ... | ඒ. ආර්. ඇම්. මුස්තාපා, සාමාන්‍ය වෙළඳ තැන 70 සහ 53, කඩ වීදිය–සම්මන්තුරෙයි |
| 26704 ... | ජිනදාස එදිරිසිංහ, 946, ප්‍රධාන පාර, දකුණු කළුතර ... | සෝමරත්න කොක්මාදුව මුදලිගේ, කළමනාකරු–ඌෂා මැෂින් සමාගම, ප්‍රධාන පාර, කළුතර දකුණ |
| 26705 ... | මාරසිංහගේ සිරිසේන, කුරෙම්පොල,පොතුහැර ... | වික්‍රමගේ තිමෝති ඩයස්, කුරෙම්පොල–පොතුහැර |
| 26706 ... | වගපේඩිගේ ජොස්ලින් සෝමවතී, කුරෙම්පොල.පොතුහැර ... | වික්‍රමගේ තිමෝති ඩයස්, කුරෙම්පොල–පොතුහැර |
| 26707 ... | හේවාගේ දියෝනිස් රොසයිරෝ, මාටුවාගල–කිරිඇල්ල ... | කේ. ඒ. ලෙයස් සිංඤෝ, මාටුවාගල–කිරිඇල්ල |
| 26708 ... | තෙල්ගේ හෙන්රි පීරිස්, 281, ඔබේසේකර පුර, රාජගිරිය ... | ගොරොක්ගහ වත්තගේ පද්මසිලි, කනත්ත පාර, පෝරේ, අතුරුගිරිය |
| 26709 ... | වික්‍රම මුදියන්සේලාගේ අබේරත්න, ඊරිමින්න, කහපත්වල ... | ලියනරාලලාගේ උක්කු බණ්ඩා (මියගොස්) උරුමකරු, ඇල්. ආර්. ඩිංගිරිබණ්ඩා, හල්වහල–කහපත්වල |
| 26710 ... | ආර්. එච්. ඩබ්ලිව්. රණසිංහ, කඳුමුල්ල—අඹගස්පිටිය ... | එච්. ඒ. සොඩිනෝනා, ඉඳුරුගල්ල–වතුරුගම |
| 26711 ... | පිම්මච්චාරිගේ ජෝන් ප්‍රනාන්දු, වෙදමාවත—කුම්බෝවිල, පිළියන්දල... | උඩවත්තගේ දෙන් ගුණසේන, වෙද මාවත, කුම්බෝවිල–පිළියන්දල |
| 26712 ... | ගෝවින්නගේ සුමනදාස පෙරේරා, සබරගමු ට්‍රේඩර්ස්, 17, ප්‍රධාන පාර, ඇහැලියගොඩ | 1. නැසීගිය ඇජ්. ඇන්. ඩී. ක්‍රෙස්ටර්ගේ උරුමකරු:—මර්වින් කෙලරන්ස් ජැන්ස් කුක්, 5, ග්‍රෙගරි පෙදෙස, කොළඹ 5.<br>2. ඩී. සී. වීරසේන, 39, ශාන්ත මයිකල් පාර, කොළඹ 3 |
| 26713 ... | රාජපක්ෂ මොහොට්ටිගේ නොහොත් කංකානිගේ ජයවර්ධන, නො. 14, මාඹුල්ගොඩ, පන්නිපිටිය | මහකුඹුරගේ ජකෝලිස් අප්පු, මාකුඹුර, පන්නිපිටිය |
| 26718 ... | ඇම්. ඇම්. අබ්දුල් කපූර් සහ ඇම්. ඇම්. ඉස්මයිල්, අංක 17, බුළුගොහො තැන්න, අකුරණ | එස්. කේ. එච්. අබ්දුල්ලා, 192, මහවීදිය, කුරුණෑගල |
| 26719 ... | හලිහංග ලියනගේ ජීරිස් ධර්මදාස, 274, ලක්මිණි ස්ටෝර්ස්, මාකොල උතුර, මාකොල | මිලනි ඇලෝසියස්, අංක 30, සමුපකාර නිවාස ක්‍රමය සමුපකාර මාවත, කිරිබත්ගොඩ, කැලණිය |
| 26722 ... | රියැන්සි තියබෝල්ඩ් විජේතිලක, 4, මහාමාය පටුමග, මහනුවර ... | දෙස්තර ඩබ්. ජේ. ගෝමස්, නො. 22, ද පොන්සේකා පෙදෙස, බම්බලපිටිය |
| 26726 ... | ගල්කන්දගේ චන්ද්‍රසේන පෙරේරා, 289, නිවන්දම, ජා-ඇල ... | ගල්කන්දගේ ගිරිගෝරිස් පෙරේරා, නිවන්දම–ජාඇල |
| 26728 ... | මැටිවල කුඹුරේගෙදර රොසලින්, නො. 46, 10 කනුව, කෙන්ගල්ල ... | ඩබ්ලිව්. ආර්. හොරතලා, නො. 6 මෝල්පේ, කෙන්ගල්ල |
| 26729 ... | රුතියා බිබි, අංක 12, පාලුගම, කැප්පෙටිපොල ... | මාපා මුදියන්සේලාගේ බණ්ඩාර මැණිකේ, හැවකේකුඹුර, අමුනු ගහ අරාවේ ගෙදර, කැප්පෙටිපොල |
| 26730 ... | හේරත් මුදියන්සේලාගේ පොඩිනෝනා නොහොත් මේරි මැගිලින්, කිරලබොක්ක–කලුගමුව | අතපත්තු මුදියන්සේලාගේ කෙන්නකෝන් බංඩා, මොරගල්ල–උහුමීය |
| 26731 ... | රත්නැක්ගෙදර පුංචි බණ්ඩා, පොත්තිලඋඩුව, තුම්පනේ ... | ජී. ඇම්. ටිකිරිබණ්ඩා, අලුදෙනිය—තුම්පනේ |
| 26732 ... | සුගතදාස විතාන, ඉද්දගොඩ–මතුගම ... | මද්දුමා ආරච්චිගේ හෙන්ද්‍රික් විජේසිංහ, ඕවිටිගල–මතුගම |
| 26733 ... | ටික්කාදූරයලාගෙදර කිරා නැතහොත් කීර්තිරත්න, පල්ලෙපොල–මාතලේ | නුම්බාන් නැතහොත් ගම්බාන් පල්ලෙපොල–මාතලේ |
| 26734 ... | කංකානම් මොහොට්ටාල්ලාගේ දයාරත්න, පන්නල–අම්පාගල ... | ඉ. මූ. ස. ගුණවර්ධන, ගුරුවල–දෙම්පේ |
| 26735 ... | 1. දෙන් දනවතී වීරකෝන්, (2) සී. වීරකෝන්, (3) නන්ද වීරකෝන්, 485, තලපත්පිටියපාර, උඩහමුල්ල, නුගේගොඩ ... | එච්. ජී. දනෝනා, 31/5, පළමුවැනි පටුමග, කිරුලපොන, කොළ[illegible] 5 |
| 26739 ... | ප්‍රින්ස් ඉග්නේසස් රෙජිනෝල්ඩ් ජයතිලක, නො. 19, නත්තරන් පොත්ත, කුන්ඩසාලේ ... | ලිලි ලූර්ඩ්ස් මාරි ගොන්සාල්, නො. 392, කටුගස්තොට පාර, මහනුවර |
| 26740 ... | ගාළුගේ කරුණාවතී ප්‍රනාන්දු සහ ඇම්. ඩබ්ලිව්. කුරේ, වේරගම–වාද්දුව ... | වර්ණකුලසූරියගේ වෛද්‍යසේන කුලසූරිය, නිව්ලංකා ස්ටෝර්ස්, ගාලුපාර, වාද්දුව |
| 26741 ... | නවගමුවගේ ගුණසේන, කේ. ඩී. අල්විස් බාරේ, ඔඩවත්ත, යටවර–කෙඹුවන ... | එඩ්මන් කළුආරච්චි, කුඩලිගම–නෑබඩ |
| 26742 ... | මලලගේ මර්තේනිස් පීරිස්, නො. 175, සිසිර නිවස, මාලමුල්ල, පානදුර ... | රණසිංහ ආරච්චිගේ ලීලාවතී, 177/10, හොරණපාර, වෑකඩ–පානදුර |

| ඉල්ලුම්පත් අංකය | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමිගේ නම සහ ලිපිනය |
|---|---|---|
| 26744 ... | කංකානම් මොහට්ටාලගේ දයාරත්න, පන්නල, අම්පාගල ... | (1) ආර්. ඇම්. පොඩිරාලහාමි, (2) ආර්. ඇම්. ඇල්බට් බංඩාර (3) ඩ. මු. ටිකිරි මැණිකේ, (4) ආර්. ඇම්. හීන්මැණිකේ, (5) ආර්. ඇම්. පොඩි මැණිකේ, ආර්. ඇම්. චන්ද්‍රරත්න බාරේ–ගෙදරවත්ත, දූරණියගල |
| 26745 ... | ගේවාපන්නගේ හෙන්රි ගුණවර්ධන, මාවතුර—ගම්පොල ... | (1) එච්. ඇල්. ගුණවර්ධන, කැලනිවත්ත ඇස්ටේට්, යටියන්තොට (2) ලොරන්ස් ගුණවර්ධන, කැලනි වතුයාය–යටියන්තොට |
| 26746 ... | බෙල්ලන විතානගේ ජිල්මන් කරුණාරත්න, දකුණු පොතුපිටිය–වාද්දුව | මිගමුවගේ ස්වර්ණවතී රණසිංහ, ඇම්. පී. රණසිංහ බාරේ, " ශ්‍රී තිලක" පොතුපිටිය–වාද්දුව |
| 26749 ... | නීටා චන්ද්‍ර සමරවීර, වලව්වත්ත, මිරිස්ස දකුණ, මිරිස්ස ... | ට්‍රින්සිනා හෙලේනා සමරවීර, "සමීර" ගබඩා වීදිය, මාතර |
| 26595 ... | සෙල්ටන් ඔගස්ටස් මුණසිංහ, ශාන්ති එන්ටර්ප්‍රයිසස් රූම් 9, බී.ආර්. සී. මාලයා, එච්. පී. ටී. ගොඩනැගිල්ල, කොළඹ 8 | ජී. පී. පී. ජයසේකර, වැල්ලගේන පාර, වැලිසර—රාගම |
| 26983 ... | මහරදගේ සියදෝරිස්, ගල්ගමුව, මහරච්චිමුල්ල, අලව්ව ... | නිසර නයිදෙලාගේ ගිරිගෝරිස් හාමි, ගල්ගමුව, මහරච්චිමුල්ල අලව්ව |
| 27069 ... | යූ. ඇල්. අබ්දුල් අසීස්, නිකගොල්ල, යටවත්ත ... | 1. සුබෙර්,නුගුපිලතෝටම, නිකගොල්ල, යටවත්ත. 2. මුසාහිර්, හොහම්මඩ කාසිම් බාරේ, නිකගොල්ල, යටවත්ත 3. සාරාඋම්මා, නිකගොල්ල, යටවත්ත 4. මොහමඩ් අලි, ප්‍රධාන පාර, නුගගහ ඉදිරිපිට, දර්ගා නගරය. 5. සහබ්දීන් කුදූස්, කැටවල, මදනාල, උල්පොත |
| 27184 ... | පොල්ගම්පොලරාල්ලාගේ සිරිසේන, 292/634/6, ජයකොඩි වත්ත, ගනේමුල්ල | විතාන පතිරන්නැහැලාගේ දෝන සාංචිනෝනා, 348/690, නිමල් නිවස, ගනේමුල්ල |
| 26863 ... | හේවා හකුරු බෙම්පි, මාගල දකුණ–කරන්දෙණිය ... | සෙල්ඩින් හේවගේ, මාගල දකුණ–කරන්දෙණිය |

8–627—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

**ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය**

වයඹ දිසාව—නාත්තන්ඩිය කොට්ඨාශය

**වාහන ගමනා ගමනයට බාධක**

තුම්මෝදර-ලුණුවිල-බෝලවත්ත මාර්ගයේ අංක 2/2 දරණ පාලම නැවත ඉදිකිරීම

ඉහත සඳහන් වැඩය ක්‍රියාත්මක කිරීම සඳහා එම මාර්ගය නැවත දැනුම් දෙනතුරු සියළුම වාහන ගමනාගමනයට වසා තබන බව මෙයින් දැනුම් දෙමි.

වසා තබන මෙම මාර්ගයේ එම ස්ථානයට ප්‍රවේශ වීමට ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානයට අයත්, කොළඹ-පුත්තලම මාර්ගයෙන් හා තෝප්පු-මාදම්පේ මාර්ගයෙන් හැකිය.

ඩී. වී. ඒ. සේනාරත්න,
වැඩ අධ්‍යක්ෂ—වයඹ දිසාව.

කුරුණෑගල,
1973. 08. 06.

8–794—73. 08. 17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

**සත්ව පනත**

ගවයින් නිවරණ කිරීම—1973/74 ආරච්චිකට්ටුව ප්‍රා. ආ. නි. කොට්ඨාශය

| කොට්ඨාශ අංකය | වසම | ස්ථානය | දිනය |
|---|---|---|---|
| 571 — | එළිවිටිය ... | ග්‍රාම සේවක කාර්යාලය, නෙලුන්කුලිය වතුයාය, ප්‍රජාමංඩල ශාලාව පිහිටි ඉඩම ... | 1973.09.01 වෙනි දින සිට 1973 .09.20 වෙනි දින දක්වා පෝය දිනයන් හැර |
| 574 ... | බංගදෙණිය ... | ග්‍රාම සේවක කාර්යාලය, බංගදෙනිය. හෙන්ද්‍රික් සිංඤෝ මයා. පදිංචි ඉඩම, පලුගස්වැව වත්ත, සිත්තමඩම වත්ත සහ දිගන්වැව රජයේ තේක්ක වත්ත | එම |
| 581ඒ. ... | දෙමටපිටිය ... | ග්‍රාම සේවක කාර්යාලය ... ... ... | එම |
| 582 ... | කරුකුපොනේ ... | ග්‍රාම සේවක කාර්යාලය ... ... ... | එම |
| 583 ... | කුසල ... | ග්‍රාම සේවක කාර්යාලය, කුසල සිරිමංගල වත්ත, පනියන්ඩිකුලම වත්ත, කුසල වත්ත ඒ කොටස සහ බී කොටස | එම |
| 585 ... | ආරච්චිකට්ටුව ... | ග්‍රාම සේවක කාර්යාලය, රාජමුතුවත්ත, රාජකදලුව වත්ත, බැරිස්ටර් වත්ත සහ මානාවේරි ලේටන් වත්ත | එම |
| 587 ... | අඩිප්පල ... | ග්‍රාම සේවක කාර්යාලය, වෙලන්කැලේ හේරත් සිංඤෝ මහතා පදිංචි ඉඩම, කැලෑගම ජෝන් සිංඤෝ මයාට අයිති ඉඩම සහ බණ්ඩාරහේන ජේම්ස් සිංඤෝ මයාට අයිති ඉඩම | එම |
| 589 ... | සුරුවිල ... | ග්‍රාම සේවක කාර්යාලය, සුරුවිල හිටියාම් මයා. පදිංචි ඉඩම, මයියාවේ ඒ. ඇම්. සිරිසේන මයා. පදිංචි ඉඩම, බෝගහවැටිය ඇම්. ඒ. චාර්ලිස් මයා. පදිංචි ඉඩම, ආනවිලුන්දවේ සී. ඩී. ජයසිංහ මයා. පදිංචි ඉඩම | එම |
| 591 ... | බත්තුලුඔය ... | ග්‍රාම සේවක කාර්යාලය, බත්තුලුඔය රෝ. ක. පාසැල් භූමියේ ඉඩම, විජයකටු පොත පල්ලිය පිහිටි ඉඩම | එම |
| 591ඒ. ... | විල්පොත ... | ග්‍රාම සේවක කාර්යාලය සහ මඩමකැලේ ... ... ... | එම |
| 592 ... | නල්ලදරන්කට්ටුව ... | ග්‍රාම සේවක කාර්යාලය, කිරිවැල්පිටිය ග්‍රා. සං. සමිති කාර්යාලය, හැළඹවටවන විමලාවතී මහත්මීට අයිති ඉඩම | එම |
| 592ඒ. ... | අත්තන්ගනේ ... | ග්‍රාම සේවක කාර්යාලය ... ... ... | එම |
| 593 ... | පුලිච්චාකුලම ... | ග්‍රාම සේවක කාර්යාලය, පුලිච්චාකුලම රජයේ පාසැල පිහිටි ඉඩම සහ තාරකුඩි විල්ලුව රජයේ පාසැල් ඉඩම | එම |
| 594 ... | උඩප්පුව ... | ග්‍රාම සේවක කාර්යාලය ... ... ... | එම |

1973 අගෝස්තු මස 04 වැනි දින,
පුත්තලම දිසාපති කාර්යාලයේ දීය.

බ. සු. විජේවීර,
පුත්තලම දිසාපති,

8–673—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

### වර්ෂ 1973 මහියංගන ඇසළ පෙරහැර උත්සවය

වර්ෂ 1948 ක් වූ සැප්තැම්බර් මස 10 වැනි දින අංක 9,902 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේද, වර්ෂ 1951 ක්වූ අගෝස්තු මස 17 වැනි දින අංක 10,203 දරණ ගැසට් පත්‍රයේ ද වර්ෂ 1955 ක්වූ මාර්තු මස 25 වැනි දින අංක 10,778 දරණ ගැසට් පත්‍රයේ ද, වර්ෂ 1967 ජූනි මස 9 වැනි දින අංක 14,752 දරණ ගැසට් පත්‍රයේ ද පළවූ මහියංගන වන්දනා ගමන් පිළිබඳ ව්‍යවස්ථා අනුව බදුල්ල දිස්ත්‍රික්කයේ දිසාපති තැන්පත් රණවීර අබේරත්න වන මම,—

(අ) 1973 අගෝස්තු 28 වැනි දින පටන් ගැනෙන මහියංගන ඇසළ පෙරහැර උත්සවය 1973 සැප්තැම්බර් 15 වැනි දිනෙන් අවසන් වන බව දැනුම් දෙමි.

(ආ) අලුත්නුවර-බිබිල ප්‍රසිද්ධ පාරේ නොහොත් බදුල්ල වීථිය විල්ලෝවැව ඉදිරියේ පිහිටි විශේෂ කඳවුරු වන්දනාකරුවන්ට ලැගුම් ගැනීම සඳහා වෙන් කරමි.

(ඇ) අලුත්නුවර-සොරබොරවැව ප්‍රසිද්ධ පාරේ පිහිටි ගම්සභා කාර්යාලය ඉදිරිපිට ඇති කුඹුරේපිටිය නමැති ඉඩම අතිරේක කඳවුරු ප්‍රදේශයක් ලෙස වෙන් කරමි.

(ඈ) වන්දනාකරුවන්ට බීම සඳහා ජලය සපයනු ලබන දූනු වත්තේ තොටට ඇතුල්වීම තහනම් කරමි.

(ඉ) දේවාල භූමිය, විහාර මලුව, දේවාල මාවත නොහොත් පල්ලේ වීථිය, මැද වීථිය, බෝ මලු වීථිය යන ස්ථානයන්හි ආහාර පිසීම තහනම් කරමි.

(ඊ) මැදවීථිය හා සංඝාවාසය ඉදිරියේ තිබෙන තාවකාලික ගොඩනැගිලිවල මා විසින් හෝ බලය ලද නිලධාරියකු විසින් නිකුත් කරන අවසර පත්‍ර පිට මල්, සුවඳ කූරු, ඉටිපන්දන්, සුවඳ වර්ග, කපුරු, භාර ඔප්පු කිරීම සඳහා අවශ්‍ය රූප යන ආදිය විකිණීම සඳහා අවසර දෙමි.

(උ) ආහාර පිළිබඳ ව්‍යවස්ථානුකූල පහත සඳහන් ස්ථානයන්හි කෑම බීම විකිණීම තහනම් කරන අතර, වෙන ඕනෑම ද්‍රව්‍යයක් විකිණීමට බලය දෙනු ලැබේ :—

(1) මගෙන් හෝ බලය ලත් නිලධාරියෙකුගෙන් අවසර පිට මාහිම පාරේ සාදන ලද තාවකාලික ගොඩනැගිලි.

(2) අලුත්නුවර-කරමැටිය—මීගහකිවුල පාරේ දකුණින් මගෙන් හෝ බලය ලත් නිලධාරියකුගේ අවසරය පිට සාදන ලද ස්ථිර සහ තාවකාලික ගොඩනැගිලි.

(3) බිබිල-අලුත්නුවර-සොරබොරවැව ප්‍රසිද්ධ පාරේ විල්ලෝවැවට සහ අලුත්නුවර තානායම් අතර සහ අලුත්නුවර-කරමැටිය-මීගහකිවුල පාරේ විල්ලෝවැවට සහ අලුත්නුවර තානායමට අතර පිහිටි බලය ලත් ස්ථිර ගොඩනැගිලි.

(ඌ) ඉහත සඳහන් " ඊ " වගන්තියේ ඒ ඒ නියම ස්ථානයන්හි හැර මහියංගන ශුද්ධ භූමියේ පහත සඳහන් ස්ථාන ඇතුළත කිසිම ද්‍රව්‍යයක් විකිණීම තහනම් කරමි :—

(අ) දේවාල මාවත නොහොත් පල්ලේ වීථිය.

(ආ) මැදවීථිය.

(ඇ) බෝමලු වීථිය.

(ඈ) දේවාල භූමිය.

(ඉ) විහාර මලුව.

2. බයිසිකල් සහ කරත්ත ඇතුලුව සියලුම රථ වාහන මගෙන් හෝ බලය ලත් නිලධාරියකුගෙන් බලපත්‍රයක් නොමැතිව කඳවුරු ප්‍රදේශයට ඇතුළත් කිරීම තහනම්ය.

3. 23/7 බෝක්කුවේ සිට ප්‍රාදේශීය වෛද්‍ය නිලධාරී තැනගේ නිවස අසල ඇති ප්‍රධාන පාරේ සන්ධිය තෙක් ඇති ප්‍රසිද්ධ පාරේ බයිසිකල් ඇතුලුව රථවාහන ගෙන යාම තහනම් කරමි.

4. බින්තැන්න ප්‍රාදේශීය ආදායම් නිලධාරී විසින් ඔහුගේ කැමැත්ත පරිදි දිය හැකිව තිබෙන රජයේ ඉඩම් වෙළඳ සැල් දැමීම සඳහා බද්දට දෙනු ලැබේ. එම ස්ථානවල සාදන ලද ගොඩනැගිලි සෞඛ්‍ය උපදෙස්වලට එකඟව නොමැති නම් මොනම වෙළඳාමක් වත් කිරීමට ඉඩ දෙනු නොලැබේ. බලය ලද නිලධාරියෙක් හෝ මවිසින් නියම කළහොත් හෝ සෑම කඩකරුවෙක්ම එම ස්ථානවල වැසිකිළි එකක් හෝ දෙකක් සෑදිය යුතු ය.

5. මගෙන් හෝ බලය ලත් නිලධාරියෙකුගෙන් ලබාගත් අවසර පත්‍ර නොමැතිව කඳවුරු ප්‍රදේශයේ කිසිම තාවකාලික ගොඩනැගිල්ලක් සෑදීමට අවසර දෙනු නොලැබේ.

6. මෙහි පහත සඳහන් ව්‍යවස්ථා මහජනයාගේ විශේෂ කල්පනාවට භාජනය කරන අතර, ඊට අනුව ක්‍රියා කිරීම අවශ්‍ය බව කරුණා වෙන් මතක් කරමි.

#### 15 වැනි ව්‍යවස්ථාව

" කිසිවෙකු විසින් ආණ්ඩුවේ ඒජන්තතුමාගෙන් කලින් අවසර ලබාගෙන මිස විධියක් වශයෙන් පාවිච්චි කරන්නාවූ හෝ වෙන්කර තිබෙන්නාවූ යම් බිමක් හෝ කඳවුරු ප්‍රදේශය තුළ ගම් ඉවුර මෙන් සෑදී තිබෙන්නාවූ යම් බිමක් ඇසුරු කරගෙන යම්කිසි මඩුවක් හෝ යම්කිසි අන්දමක ගොඩනැගිල්ලක් සෑදීම හෝ විශාල කිරීම නොකළ යුතු සි. "

" රතිඤ්ඤා, වෙඩි ආදිය කඳවුරු ප්‍රදේශයේ පත්තු කිරීම තහනම් ය. "

#### 17 වැනි වගන්තිය

" ආණ්ඩුවේ දිසාපතිගේ හෝ බලය ලත් නිලධාරියාගේ අනුමැතිය නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු ප්‍රදේශය තුළ ටිකට්, පත්‍ර, කොඩි විකිණීමෙන් හෝ වෙනත් අන්දමකින් කුමන කාර්යයක් සඳහා හෝ ආයක් මුදල් එකතු කිරීම හෝ එකතු කිරීමට තැත් කිරීම හෝ නොකළ යුතු ය.

රණවීර අබේරත්න,
බදුල්ල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1973 අගෝස්තු මස 03 වැනි දින,
බදුල්ල කච්චේරියේ දී ය.

8-797/1 —73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

### වර්ෂ 1973 මහියංගන ඇසළ පෙරහැර උත්සවය

වර්ෂ 1948 ක් වූ සැප්තැම්බර් මස 10 වැනි දින අංක 9,902 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේද, වර්ෂ 1951 ක්වූ අගෝස්තු මස 17 වැනි දින අංක 10,283 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ද වර්ෂ 1955 ක්වූ මාර්තු මස 25 වැනි දින අංක 10,773 දරණ ගැසට් පත්‍රයේ ද, පළවූ මහියංගන වන්දනාකරුවන් සම්බන්ධව 10 (1) දරණ ව්‍යවස්ථා අනුව බදුල්ල දිස්ත්‍රික්කයේ දිසාපති තැන්පත් රණවීර අබේරත්න වන මම, මෙහි පහත සඳහන් ස්ථාන වන්දනා කරුවන්ට කෑම බීම බෙදා දීම සඳහා හෝ විකිණීම සඳහා හෝ වෙන් කරමි.

(අ) බදුලු වීථිය නොහොත් බිබිල-අලුත්නුවර ප්‍රසිද්ධ මහ පාර දිගේ සහ මූන පා සාදා ඇති ගම්සභාවෙන් බලය ලත් ස්ථිර ගොඩනැගිලි.

(ආ) බිබිල-අලුත්නුවර-සොරබොරවැව ප්‍රසිද්ධ මහ පාරේ අලුත්නුවර තානායමට උතුරෙන් හා විල්ලෝවැවට නැගෙනහිරින් මගෙන් හෝ බලය ලත් නිලධාරියෙකුගෙන් හෝ අවසර ගෙන තාවකාලික හෝ ස්ථිර ගොඩනැගිලි.

(ඉ) කඳවුරු ප්‍රදේශයේ වන්දනාකරුවන්ට ලැගුම් පිණිස වෙන් කරන ලද පිට්ටනියේ මගෙන් හෝ බලය ලත් නිලධාරී තැනගෙන් හෝ ලබාගත් බලපත්‍ර පිට සාදන ලද තාවකාලික ගොඩනැගිලි.

(ඊ) විල්ලෝවැවට දකුණින් පිහිටි අලුත්නුවර-මීගහකිවුල ප්‍රසිද්ධ මහ පාර දිගේ සහ මූන පා සාදා තිබෙන තාවකාලික හෝ ස්ථිර ගොඩනැගිලි, පාර මධ්‍යයේ සිට ගොඩනැගිල්ල ඉදිරියට දුර ප්‍රමාණය අඩි 50 කට අඩුව තිබුනොත්, එම ගොඩනැගිල්ල පාරේ පිහිටි ගොඩනැගිල්ලක් හැටියට සලකනු ලැබේ.

2. ඉහත සඳහන් ස්ථාන හැර මහියංගන කඳවුරු ප්‍රදේශය ඇතුළත අන්කිසි ස්ථානයක මොනම අන්දමේ කෑමක් හෝ බීමක් හෝ බෙදා දීම තහනම් ය.

රණවීර අබේරත්න,
බදුල්ල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1973 අගෝස්තු මස 03 වැනි දින,
බදුල්ල කච්චේරියේ දී ය.

8-797/2 —73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

## උකස් පනත

(89 වන අධිකාරය වන) උකස් පනතේ 3 (ඇ) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සහ **එකී** පනතේ 114(2) වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශය පිට වාණිජ අධ්‍යක්ෂ කිරිබණ්ඩා දිසානායක වන මම, එම පනතේ කාර්යයන් සඳහා සීමාසහිත ද පිනෑන්ස් කම්පනි නමැති ආයතනය ණය දෙන අනුමත කළ ආයතනයක් වශයෙන් මේ නිවේදනයෙන් ප්‍රකාශ කරමි.

වාණිජ අධ්‍යක්ෂ.

1973 අගෝස්තු මස 6 වෙනි දින,
කොළඹ දී ය.

8–756/1—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

## භාරකාර ආදායම් ආඥාපනත

(86 වෙනි අධිකාරය වන) භාරකාර ආදායම් ආඥාපනතේ 5(1) (අ) වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වාණිජ අධ්‍යක්ෂ කිරිබණ්ඩා දිසානායක වන මම, සීමාසහිත ද පිනෑන්ස් කම්පනි නමැති ආයතනය ඒ ආඥාපනතේ කාර්යයන් සඳහා අනුමත කළ ණය දෙන ආයතනයක් විය යුතු යයි මේ නිවේදනයෙන් ප්‍රකාශ කරමි.

වාණිජ අධ්‍යක්ෂ.

1973 අගෝස්තු 6 වෙනි දින,
කොළඹ දී ය.

8–756/2—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත මිස ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|
| අගෝස්තු | 73.08.03 | සිකුරාද | ... | 73.07.27 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.10 | සිකුරාද | ... | 73.08.03 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.17 | සිකුරාද | ... | 73.08.10 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.24 | සිකුරාද | ... | 73.08.17 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.31 | සිකුරාද | ... | 73.08.24 | සිකුරාද | දවල් | 12.00 |
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද | ... | 73.08.31 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.14 | සිකුරාද | ... | 73.09.07 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.21 | සිකුරාද | ... | 73.09.14 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.28 | සිකුරාද | ... | 73.09.21 | සිකුරාද | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.